# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

# 2024




**ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**
**இலங்கை தேசிய புலமைச் சொத்து அலுவலகம்**
**National Intellectual Property Office of Sri Lanka**

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு, மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சு
Ministry of Trade, Commerce, Food Security and Co-operative Development

# වාර්ෂික කාර්යසාධන වාර්තාව 2024

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

3 වන මහළ, සමාගම් මැදුර, නො. 400, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2024

**ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**

**රා.මූ.ච. 02/2020 මාර්ගෝපදේශ අංක 14 හා රා.මූ.ච. 01/2020 මාර්ගෝපදේශ අංක 05 ආකෘති අනුව මෙම වාර්තාව සකස් කර ඇත.**

# පටුන


| | | |
|---|---|---|
| 01. පරිච්ජේදය | ආයතනික පැතිකඩ | 1 |
| 02. පරිච්ජේදය | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 15 |
| 03. පරිච්ජේදය | වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය | 35 |
| 04. පරිච්ජේදය | කාර්යසාධන දර්ශක | 59 |
| 05. පරිච්ජේදය | බුද්ධිමය දේපළ කාර්යාලය විසින් හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු | 61 |
| 06. පරිච්ජේදය | මානව සම්පත් පැතිකඩ | 65 |
| 07. පරිච්ජේදය | අනුකූලතා වාර්තාව | 73 |
| 08. පරිච්ජේදය | විශේෂ සිදුවීම් | 89 |

# බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය



ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2024 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව ඉදිරිපත් කරනු ලැබීමට හැකි වීම සතුටට කරුණකි.

යම් රටක තිරසාර සංවර්ධනයක් ඇති කිරීමෙහි ලා බුද්ධිමය දේපළ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එබැවින්, ලොව පුරා ඇති බුද්ධිමය දේපළ කාර්යාල විසින් ස්වකීය රටවල ඵලදායී හා සමබර බුද්ධිමය දේපළ ක්‍රම ස්ථාපනය කිරීම සඳහා නිරතුරු කටයුතු කරනු ලබයි.

මෙවන් පසුබිමක, ජාතික තරගකාරීත්වය වැඩි දියුණු කරන අතරම, අසාධාරණ තරගය අවම කිරීම සඳහා බුද්ධිමය දේපළ සම්බන්ධිත ප්‍රබල නීතිමය රාමුවක් නිර්මාණය කිරීම ඔස්සේ, තාක්ෂණික දියුණු වීම් වල වාසිය සියලු ශ්‍රී ලාංකිකයන් වෙත ලබා දීම සඳහා, ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය ද, මහත් ප්‍රයත්නයක් දරනු ලබයි.

ශ්‍රී ලංකාව තුල සියලු ම ආකාරයේ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පරිපාලනය කරනු ලබන එකම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය වේ. එබැවින්, මෙම කාර්යාලය විසින් ජාත්‍යන්තර වෙනස් වීම් වලට අනුව සහ ශ්‍රී ලාංකිකයන් ගේ වර්තමාන සහ අනාගතයේ දී වෙනස් විය හැකි අවශ්‍යතාවලට අනුකූල වෙමින්, දැනට ක්‍රියාත්මක නීතිමය රාමුව සඳහා අවශ්‍ය ව පවතින කාලීන සංශෝධන හා නව රෙගුලාසි යෝජනා කරනු ලබයි.

එහි එක් පියවරක් වශයෙන්, දේශීය වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ පහසුකම් සපයනු ලබන හා ජාත්‍යන්තර වෙළඳ ලකුණු ශ්‍රී ලංකාවේ අයැදුම් කිරීම වඩා පහසු කෙරෙන, ලෝක බුද්ධිමය දේපළ සංවිධානය මගින් පරිපාලනය කරනු ලබන, මැඩ්රිඩ් සන්ධාන පත්‍රය වෙත ප්‍රවේශ වීම සඳහා, බුද්ධිමය දේපළ පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීමට, කටයුතු කරමින් පවතී.

ඒ සඳහා වන නීති කෙටුම්පත්, ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ සහ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ නිරීක්ෂණ ද සහිතව, රේඛීය අමාත්‍යාංශය වන වෙළෙඳ වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය හරහා, නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීමටත් ගත වූ වර්ෂය තුළ හැකි වී තිබේ.

එසේම, සිය නිර්මාණ සඳහා කලාකරුවන් වෙත කතෘභාග හිමි කර දීම විධිමත් කිරීම අරමුණුකොට, සාමූහික සංගම් සහ කතෘ අයිතිය සම්බන්ධයෙන් සාමූහික සංගම්

සමඟ පුළුල් සාකච්ඡාවකට එළඹීමටත් ඒ අනුව නව රෙගුලාසි කෙටුම්පත් කිරීමටත්, හැකියාව ලැබුණි.

තවද, අපනයන අංශයෙහි ප්‍රවර්ධනයට හේතු වන, ශ්‍රී ලංකාවේ සම්භවය වන භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා, සංශෝධිත බුද්ධිමය දේපළ පනත සඳහා වන රෙගුලාසි සකස් කිරීම සඳහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ නිරීක්ෂණයන් නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීමට ද, ඒ අනුව භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා නව රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමටත් ගතවූ වර්ෂය තුල හැකියාව ලැබුණි. ඒ අනුව ඉදිරියේ දී සිලෝන් සිනමන්, සිලෝන් ටී ආදී භූගෝලීය දර්ශක සඳහා පවතින ආරක්ෂාව තහවුරු කිරීම මගින් අපනයන වෙළඳ පොළ වල පවතින අසාධාරණ තරඟය අවම කරලීමට හැකියාව උදාවනු ඇත.

එසේම, දිවයිනෙහි සියලු පළාත් ආවරණය වන පරිදි, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධ කර ගනිමින් බුද්ධිමය දේපළ විෂය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක්, මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වීමට ද ගතවූ වර්ෂය තුළ දී කටයුතු කරන ලදී. එමගින්, විශේෂයෙන්ම දුර බැහැර ප්‍රදේශවල ජනතාව තුළ බුද්ධිමය දේපළ සම්බන්දයෙන් වන දැනුවත්භාවය වර්ධනය කිරීමට අපේක්ෂා කරන ලදී. මෙහිදී දමිළ ප්‍රදේශ සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වන ලද වැඩසටහන් වෙත සජීවී දමිළ පරිවර්තන ලබා දීම් ආදී නිර්මාණශීලී කටයුතු ඔස්සේ, වැඩි ඵලදායීතාවක් අත් කර ගැනීමට කටයුතු කරන ලදී.

පසුගිය වසරෙහි රට තුළ පැවති සමාජීය සහ ආර්ථිකමය අභියෝග හමුවේ වුවද සේවාලාභීන් සඳහා ප්‍රශස්ත සේවාවක් ලබාදීමට ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ කාර්ය මණ්ඩලයට හැකි වී තිබේ. ඒ අනුව, ඇතැම් අංශවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය 100% මට්ටමට ළඟාකර ගැනීමේ හැකියාව ලැබීම සම්බන්ධව නිහතමානීව සතුටු වෙමි.

ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා ඉදිරි ගමන් මඟ පෙන්වීම හා සහයෝගය ලබා දෙනු ලබන, බුද්ධිමය දේපළ කාර්යාලයේ රේඛීය අමාත්‍යාංශය වන, වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයට සහ බුද්ධිමය දේපළ උපදේශන කොමිසමට, මාගේ කෘතඥතාව පළ කරනු කැමැත්තෙමි.

අවසාන වශයෙන්, නිර්මාණශීලී ප්‍රයත්න සමාජීය යහපත උදෙසා යොදා ගැනෙන යහපත් ලොවක් තහවුරු කිරීම සඳහා, අප සමඟ අත්වැල් බැද ගෙන සාමූහික ව කටයුතු කිරීම සඳහා ඔබ සැමට කාරුණිකව ආරාධනා කරන්නෙමි.



එච්. එස්. හෙට්ටිහෙලගෙ

බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)

# 1

# පළමු පරිච්ඡේදය




- ## ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3 ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- වෙළඳ ලකුණු අංශය
- පේටන්ට් හා කාර්මික සැලසුම් අංශය
- තොරතුරු තාක්ෂණ අංශය
- ආයතන අංශය
- ගිණුම් අංශය
- සැලසුම් අංශය

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

## 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ පිහිටුවන ලද, ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පද්ධතිය පරිපාලනය කිරීම සම්බන්ද බලය පැවරී ඇති රාජ්‍ය ව්‍යුහය වේ. එය වර්තමාන රජයෙහි, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය ට අයත් දෙපාර්තමේන්තුවකි.

ඕනෑම රටක සමස්ත ආර්ථික සංවර්ධනයේ දී, විශේෂයෙන් දැනුම මූලික කරගත් වර්තමාන සන්දර්භය තුළ, බුද්ධිමය දේපළ අත්‍යවශ්‍ය සහ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. මානව ප්‍රයත්නයන් ක්‍රියාත්මක වන සෑම ක්ෂේත්‍රයක් සඳහාම ආයෝජන, නවෝත්පාදන හා නිර්මාණශීලී ක්‍රියාකාරිත්වය, තාක්ෂණ හුවමාරුව සහ දැනුම් ප්‍රවාහයේ අවශ්‍යතාව, වර්තමානයේ දී ශ්‍රී ලංකාව ද අත් විඳිමින් පවතී. ඒ අනුව, සමාලෝචනයට භාජනය කරනු ලබන 2024 වර්ෂය තුළ, ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පරිපාලනය සඳහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් සිදු කරන ලද කාර්යයන් පිළිබඳව සංක්ෂිප්ත සටහනක් මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කෙරෙනු ඇත.

බුද්ධිමය දේපළ යනු, එයටම ආවේණික සුවිශේෂී ලක්ෂණ සහිත, තවත් එක් දේපළ ආකාරයකි. මානව බුද්ධිය මෙහෙයවා සිදුකරන නිර්මාණාත්මක කාර්යය සඳහා නීතිමය වශයෙන් බලාත්මක කළ හැකි අයිතිවාසිකම් කාණ්ඩය බුද්ධිමය දේපළ ලෙස සලකනු ලැබේ. සාහිත්‍ය, කලා හෝ විද්‍යාත්මක කාර්යයන්, ප්‍රාසාංගික කලා ශිල්පීන්ගේ රඟ දැක්වීම්, හඬ පටි, විකාශය කිරීම්, නව නිපැයුම්, කාර්මික සැලසුම්, වෙළඳ ලකුණු, සේවා ලකුණු, වාණිජ නම් සහ තනතුරු, අසාධාරණ තරඟයට එරෙහිව ආරක්ෂාව, භූගෝලීය දර්ශක, හෙළිදරව් නොකළ තොරතුරු සහ සංයුක්ත පරිපථ සඳහා වූ පිරිසැලසුම් නිර්මාණ වැනි ක්ෂේත්‍රවලට අදාළ අයිතිවාසිකම් මීට ඇතුළත් වේ. පුද්ගලයන් විසින් හිමිකාරිත්වය දරන අනෙකුත් දේපළ ආශ්‍රිතව දක්නට ලැබෙන සමහර ලක්ෂණ බුද්ධිමය දේපළ සඳහා ද පොදු වේ. නිදසුනක් ලෙස, බුද්ධිමය දේපළ වත්කමක් වන අතර එයට මූල්‍යමය වටිනාකමක් ද සහිත වීම දැක්විය හැකිය. අනිත් ඕනෑම ආකාරයක දේපළක් සඳහා මෙන්ම බුද්ධිමය දේපළ සඳහා ද හිමිකරගැනීම, වෙනත් පාර්ශවයක් වෙත අයිතිය පැවරීම, විකිණීම හෝ බලපත්‍ර ගිවිසුම්ගත වීම ආදිය සිදුකළ හැකි ය. බුද්ධිමය දේපළ හඳුනාගැනීම හෝ එහි භෞතික පරාමිති මඟින් නිශ්චය කරගැනීම හෝ සිදුකළ නොහැකි බැවින් බුද්ධිමය දේපළ යනු අස්පර්ශනීය දේපළකි. එසේම, බුද්ධිමය දේපළ ආරක්ෂා කරගැනීම සඳහා එය ප්‍රත්‍යක්ෂ ආකාරයකට හෝ ක්‍රමයකට නිශ්චිතව පල කළ යුතු වේ.

බුද්ධිමය දේපළ ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ. එනම්,

1. නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර, වෙළඳ ලකුණු සහ සේවා ලකුණු, කාර්මික සැලසුම් සහ භූගෝලීය දර්ශක අන්තර්ගත **කාර්මික දේපළ** සහ,
2. ශාස්ත්‍රීය හා කලාත්මක කෘති ආවරණය කරන ප්‍රකාශන හිමිකම්, ප්‍රාසාංගික කලාකරුවන්ගේ ශාබ්දික පටිගත කිරීම් හෝ තැටිගත කිරීම්, නිෂ්පාදකයන්ගේ සහ විකාශන ආයතනවල අයිතිවාසිකම්, **සම්බන්ධිත අයිතිවාසිකම්** හෝ **ආසන්න අයිතිවාසිකම්** වශයෙනි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

නිර්මාණශීලීත්වය සහ නව්‍යකරණය ප්‍රවර්ධනය තුළින් ශ්‍රී ලංකාව පිබිදෙන ආර්ථිකයක් බවට පත් කිරීම.

**මෙහෙවර**

බුද්ධිමය දේපළ නිර්මාණය, ආරක්ෂා කිරීම හා වාණිජකරණය ඔස්සේ ආර්ථික තිරසාරත්වය ප්‍රවර්ධනය කරන බුද්ධිමය දේපළ පද්ධතියක් ස්ථාපනය වීම සහතික කිරීම.

**අරමුණු**

- ජාතියේ නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය කිරීම.
- වෙළෙඳ කටයුතු සඳහා පහසුකම් සැලසීම.
- ආයෝජන ප්‍රවර්ධනය.
- පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම සහ දැනුම මූලික කර ගත් ගෝලීය ක්‍රියාකාරීත්වයට ජාතික ආර්ථිකය ඒකාබද්ධ කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම සහ සාමූහික සංගම් ලියාපදිංචි කිරීම හා පරිපාලනය කිරීම ඇතුළුව බුද්ධිමය දේපළ පරිපාලනය කිරීම.

- බුද්ධිමය දේපළ පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සහ ප්‍රචලිත කිරීම.

- බුද්ධිමය දේපළ විෂය පිළිබඳ දැනුවත් භාවය ප්‍රවර්ධනය කිරීම.

- ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඳහා බුද්ධිමය දේපළ භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම.

- බුද්ධිමය දේපළ ආශ්‍රිත ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වගකීම සපුරාලීම සහ ඒ පිළිබඳ කලාපීය සහ අන්තර්ජාතික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම.

- බුද්ධිමය දේපළ පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා කිරීම.

- ප්‍රකාශන අයිතිය සහ සම්බන්ධිත අයිතිවාසිකම් පිළිබඳ ක්ෂේත්‍රයේ ආරවුල් නිරාකරණය, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් බලාත්මක කිරීමට පහසුකම් සැලසීම.

- බුද්ධිමය දේපළ නියෝජිතයන් ලියාපදිංචි කිරීම සහ පරිපාලනය.

## 1.4 සංවිධාන සටහන



අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ)
අධ්‍යක්ෂ (නීති)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ)
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (පාලන)
ගණකාධිකාරී
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (නීති)
අභ්‍යන්තර විගණක
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
ජ්‍යේෂ්ඨ පරීක්ෂක
සංවර්ධන නිලධාරී
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
රියදුරු
කාර්යාල කාර්ය සහායක
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
සංවර්ධන නිලධාරී
බුද්ධිමය දේපළ නිලධාරී
සංවර්ධන නිලධාරී
සංවර්ධන නිලධාරී

## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- **වෙළඳ ලකුණු අංශය**
- **පේටන්ට් හා කාර්මික සැලසුම් අංශය**
- **තොරතුරු තාක්ෂණ අංශය**
- **ආයතන අංශය**
- **ගිණුම් අංශය**
- **සැලසුම් අංශය**

**<u>වෙළඳ ලකුණු අංශය</u>**




බුද්ධිමය දේපළ යටතේ කාර්මික දේපළ ලෙස වර්ගීකරණය කර ඇති වෙළඳ ලකුණු සහ සේවා ලකුණු ලියාපදිංචි කිරීම මගින් වෙළඳ ලකුණු අංශය ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය තුළ වැදගත් සේවාවක් සපයනු ලබයි.

අධ්‍යක්ෂ (නීති) මෙම අංශයෙහි ප්‍රධානත්වය උසුලන අතර, සහකාර අධ්‍යක්ෂ (නීති) නිලධාරීන් තිදෙනෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ බුද්ධිමය දේපළ නිලධාරීන් සිව් දෙනෙකු, සංවර්ධන නිලධාරීන් දොළොස් දෙනෙකු, කළමනාකරණ සේවා නිලධාරීන් දෙදෙනෙකු හා කාර්යාල කාර්ය සහයක වරුන් සිව් දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් විසින් මෙම අංශයෙහි කාර්යයන් ඉටු කරනු ලබයි.

බුද්ධිමය දේපළ පනතෙහි විධි විධාන ප්‍රකාරව, වෙළෙඳ ලකුණක් වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පතක් එය ලියාපදිංචිය හා නැවත අලුත් කිරීම දක්වා වූ සංකීර්ණ ක්‍රියාවලියකට භාජනය වන අතර, එය පහත ආකාරයෙන් දැක්විය හැකිය. එනම්,

1. පනතේ 106-110 දක්වා වගන්ති වලට අනුකූලව අයදුම්පත සම්පූර්ණ කර ඇත්දැයි තහවුරු කර ගැනීම සඳහා මූලික හා ද්විතීක පරීක්ෂාවක් කිරීම.

2. මූලික ප්‍රධාන වැරදි නොමැති අයදුම්පත්, පනතේ 103 හා 104 වගන්ති යටතේ සෝදිසි පරීක්ෂාවට ලක් කර, ලකුණු පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ ලිපි නිකුත් කිරීම.

3. පිළිගනු ලැබූ වෙළඳ ලකුණු රජයේ ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා අදාල ගැසට් නිවේදන සකස් කිරීම.

4. ඒක පාර්ශවීය/ ද්වි පාර්ශවීය විභාග පැවැත්වීම.

5. ලකුණ ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසු විරෝධතා ගොනු කර නොමැති නම් වෙළඳ ලකුණු ලියාපදිංචිය වෙත යොමු කර ලියාපදිංචි සහතික නිකුත් කිරීම.

6. නියම කර ඇති කාල සීමාව තුළ නියමිත ගාස්තු ගෙවූ පසු, වසර 10ක් සඳහා ලියාපදිංචිය අලුත් කිරීමේ සහතික නිකුත් කිරීම.

7. වෙළඳ ලකුණු පැවරුම්, නම/ලිපිනය වෙනස් කිරීම් හා බලපත්‍ර ගිවිසුම් වාර්තා කිරීම.

8. බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන් අධිකරණය හමුවේ පෙනී සිටීම හා සාක්ෂි ලබා දීම, ඒ සම්බන්ධව ගරු නීතිපතිතුමා සමඟ ලිපි හුවමාරු කිරීම හා ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කිරීම. රජයේ නිලධාරීන් සමඟ උපදේශණාත්මක හමුවීම් වලට සහභාලී වීම. පරීක්ෂණ වල දී පොලිස් නිලධාරීන් වෙත සාක්ෂි ලබා දීම සහ වෙළඳ ලකුණු ආශ්‍රිත ගැටලු වලදී අදාල රජයේ ආයතන සමග සම්බන්ධිකරණ කටයුතු සිදු කිරීම.

9. වෙළඳ ලකුණු පිලිබඳ දැනුවත් කිරීම් වලට අදාල සම්මන්ත්‍රණ/ වැඩමුළු/සැසිවාර/ප්‍රදර්ශන ආදිය සඳහා සහභාගී වීම.

10. වෙළඳ ලකුණු වලට අදාල සංඛ්‍යා ලේඛන හා අනිකුත් දත්ත සැකසීම හා පවත්වාගෙන යාම සහ අවශ්‍ය පාර්ශව සඳහා එකී අදාල තොරතුරු ලබා දීම.

11. ප්‍රකාශන හිමිකම් සහ භූගෝලීය දර්ශක ආශ්‍රිත රාජකාරී කටයුතු.

## පේටන්ට් හා කාර්මික සැලසුම් අංශය




පේටන්ට් අයදුම්පත් පරීක්ෂා කිරීම, පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීම, කාර්මික සැලසුම් අයදුම්පත් පරීක්ෂා කිරීම හා කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම පේටන්ට් හා කාර්මික සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යභාරයන් වේ. දේශීය හා විදේශීය යන කාණ්ඩ දෙක යටතේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය වෙත ගොනු කරනු ලබන පේටන්ට් හා කාර්මික සැලසුම් අයදුම්පත් පරීක්ෂාව සඳහා මෙම අංශය වෙත යොමු කෙරේ. එසේම ඉහත කී විදේශ අයදුම්පත් සැලකූ විට, ශ්‍රී ලංකාව 1982 සිට පේටන්ට් සහයෝගීතා ගිවිසුමෙහි (PCT) සාමාජික රටක් වන බැවින්, එම ගිවිසුම යටතේ විදේශීය අයදුම්කරුවන් විසින් මෙරට ලියාපදිංචිය සඳහා ගොනු කරනු ලබන පේටන්ට් අයදුම්පත් ද, පැරිස් ගිවිසුම යටතේ වන පේටන්ට් හා කාර්මික සැලසුම් අයදුම්පත් ද මෙම අංශය වෙත යොමු කරනු ලබයි. පේටන්ට් හා තාක්ෂණික තොරතුරු සඳහා ප්‍රවේශය ලබා දීම අරමුණු කර ගත්, තාක්ෂණික නවෝත්පාදන සහයෝගීතා මධ්‍යස්ථාන (TISC) ව්‍යාපෘතිය ද ක්‍රියාත්මක කිරීමද මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

පේටන්ට් හා කාර්මික සැලසුම් අංශයහි, එක් අධ්‍යක්ෂවරියක් (තොරතුරු හා පරීක්ෂණ) සහ සහකාර අධ්‍යක්ෂවරුන් (තොරතුරු හා පරීක්ෂණ) දෙදෙනෙකු ද, සංවර්ධන

නිලධාරීන් 11 දෙනෙක් ද, එක් කළමණාකරණ සේවා නිලධාරිණියක් ද, එක් කාර්යාල කාර්ය සහයකවරියක් ද, එක් පරිගණක ක්‍රියාකරන්නියක් ද සේවය කරනු ලැබේ.

මෙම අංශය පේටන්ට් සහ කාර්මික සැලසුම්වලට අදාළ දත්ත සහ තොරතුරු පවත්වාගෙන යනු ලබන අතර බුද්ධිමය දේපළ පනතේ විධිවිධාන වලට අනුකූලව අදාළ තොරතුරු සාමාන්‍ය ජනතාව, විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සහ පාර්ශවකරුවන් වෙත බෙදා හැරීමේ වගකීම ද දරයි.

## තොරතුරු තාක්ෂණ අංශය



බුද්ධිමය දේපළ පරිපාලන ක්‍රියාවලියේ විවිධ පියවර වලදී, තොරතුරු තාක්ෂණය වැදගත් වේ. ඒ අනුව, බුද්ධිමය දේපළ කාර්යාලයේ පරිගණක පද්ධතිය වන කාර්මික දේපළ ස්වයංක්‍රීයකරණ පද්ධතිය (IPAS ) යාවත්කාලීන කිරීම, අයදුම්පත් ගොනු කිරීමේ දී පරිගණක පද්ධතිය හරහා අයදුම්පත් ගොනු කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීම, වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම හා ආයතන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණික සහය ලබා දීම ආදිය තොරතුරු තාක්ෂණ අංශය යටතේ ඉටු කරනු ලබයි.

අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ) ප්‍රධානත්වය දරන මෙම අංශය, එක් සහකාර අධ්‍යක්ෂවරියක් (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ) සහ සංවර්ධන නිලධාරින් දෙදෙනකු ද, කළමනාකරණ සේවා නිළධාරිනියක හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිළධාරිනියක ගෙන් සමන්විත වේ.

## ආයතන අංශය



දෙපාර්තමේන්තුවෙහි පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා සඳහා කාර්යක්ෂමව සහ ඵලදායීව කටයුතු කරනු පිණිස අවශ්‍ය වන මානව සම්පත් කළමනාකරණය කිරීම ආයතන අංශයෙහි ප්‍රධාන කාර්යභාරය වේ.

එහිදී දෙපාර්තමේන්තුවෙහි දැක්ම හා මෙහෙවර කරා ගමන් කළ හැකි, නිපුණත්වයෙන් යුක්ත, සුදුසුකම් සහිත පුද්ගලයින්, දෙපාර්තමේන්තුව සඳහා බඳවා ගැනීමටත්, ඒ සඳහා අවශ්‍ය උපාය මාර්ගික සැලසුම් සකස් කිරීමටත්, සේවක ගැටලු හඳුනාගනිමින් ඒවා නිරාකරණය කර ඔවුන්ගේ පූර්ණ දායකත්වය දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු සඳහා ලබා ගැනීමටත් කටයුතු කරනු ලබන අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ආදී රාජ්‍ය ආයතනවලින් වරින් වර නිකුත් කරනු ලබන නියෝග, මාර්ගෝපදේශ හා නීති-රීතින් ට අනුගත වෙමින් නිලධාරින් බඳවා ගැනීම, උසස් කිරීම, ස්ථානමාරුකිරීම, විශ්‍රාම ගැන්වීම සහ කාර්ය සාධනයන් පවත්වා ගැනීම ද මෙම අංශය මඟින් ඉටුකරනු ලබයි.

ආයතන අංශය මඟින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත ආකාරයෙන් දැක්විය හැකිය. එනම්,

- බඳවා ගැනීමේ පටිපාටිවලට අනුකූලව පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් හා උසස් කිරීම.
- සේවක වාර්තා තබා ගැනිම හා රහස්‍යභාවය සුරැකෙන අයුරින් පවත්වාගෙන යාමට කටයුතු කිරීම.
- කාර්ය සාධන කළමනාකරණය.
- විශ්‍රාමික නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් සැකසීමේ කටයුතු.
- අභ්‍යන්තර ස්ථානමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වැඩිදියුණු කිරිම සඳහා දේශිය හා විදේශීය පුහුණු අවස්ථා ලබාදිම හා අදාළ සම්බන්ධීකරණ කටයුතු.
- දෙපාර්තමේන්තු නිලධාරින්ගේ විනය පවත්වාගෙනයාම හා ඊට අදාළ කටයුතු.
- දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ කටයුතු.

## ගිණුම් අංශය



මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සියලුම ආදායම් සඳහා ඇස්තමේන්තු සැකසීම, දෙපාර්තමේන්තු සංවර්ධන කටයුතු ඇතුළු සියළු කාර්යයන් සඳහා වියදම් ඇස්තමේන්තු සැකසීම, ආදායම් නිසි පරිදි වර්ගීකරණය කොට ගිණුම් ගත කිරීම, වියදම් ගිණුම්ගත කිරීම, වාර්තා කිරීම, කාර්යාලයීය නිලධාරින්ගේ වැටුප් ගෙවීම, දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාකරණය, ප්‍රසම්පාදන කටයුතු හා බුද්ධිමය දේපළ අරමුදලේ අරමුදල් කළමනාකරණය ගිණුම් අංශය සතු ප්‍රධාන කාර්යයන් වේ. මෙම අංශයෙහි ගණකාධිකාරී අධීක්ෂණය යටතේ නිලධාරින් 09 දෙනෙකු හා කාර්යාල කාර්ය සහයක වරියක සේවයේ නිරත වේ.

## සැලසුම් අංශය



ආයතනයෙහි දැක්ම සහ මෙහෙවර ප්‍රකාශ වලට අනුකූල වන ලෙසින්, අරමුණු මුදුන් පත් කර ගැනීම සඳහා උපායමාර්ග සැලසුම සකස් කිරීමත්, ආයතනික ශක්‍යතාව සහ හඳුනා ගන්නා ලද සංවර්ධන විභවතා මත පදනම්ව, ආයතනයෙහි විශේෂිත අරමුණු මුදුන් පත් කර ගැනීම සඳහා වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමත්, එයට අනුකූලව සංවර්ධන ව්‍යාපෘති මෙහෙයවීමත්, අධීක්ෂණය සහ පසු විපරම් කිරීමත්, ප්‍රගතිය විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීමත්, විශේෂයෙන් ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) වෙත ඉදිරිපත් කළයුතු සංඛ්‍යාලේඛන සහ ප්‍රගති වාර්තා අවශ්‍ය විශ්ලේෂණ සහිතව ඉදිරිපත් කිරීමත් සැලසුම් අංශයේ කාර්යභාරය අතර වේ.

එමෙන්ම, සේවාලාභී ප්‍රඥප්තිය ආයතනය තුළ ස්ථාපිත කිරීම මඟින් ආයතනය සහ මහජනතාව අතර අවබෝධය සහ විශ්වසනීයත්වය ඉහළ නැංවීමත්, එමඟින් ආයතනික ඵලදායීතාව ඉහළ නැංවීමත්, ආයතනයෙහි මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම සහ නිලධාරින්ගේ කාර්යසාධනය හා සම්බන්ධ සැලසුම් සකස් කිරීමත්, ආයතනයේ ඉලක්ක වලට අනුකූලව

දේශීය සහ විදේශීය පුහුණු අවස්ථා හඳුනා ගැනීමත්, සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ගෙවීම් කටයුතු වලට අනුකූලව නිර්දේශ ඉදිරිපත් කිරීමත්, ප්‍රසම්පාදන තීරණ ගැනීම සඳහා සහය වීමත්, සැලසුම් අංශයෙහි කාර්යභාරයට අයත් වේ.

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි සැලසුම් අංශය, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) වරයකුගෙන් සහ එක් සංවර්ධන නිලධාරිනියකගෙන් සමන්විත වේ.

## 1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

- ✓ රජයේ ඒකාබද්ධ අරමුදල - ශිර්ෂය 299
- ✓ බුද්ධිමය දේපළ අරමුදල

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

- ✖ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි ලිපිගොනු පරිලෝකනය (Scan) කිරීමේ ව්‍යාපෘතිය:

ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි ලක්ෂ දෙකකට නොඅඩු බුද්ධිමය දේපළ හා සම්බන්ධ ලිපිගොනු ප්‍රමාණයක් භෞතික ව භාවිතා වේ. මේවා ඉදුරාම පරිහරණය කලහැකි වන ලෙස ලේඛණාගාර වල ගබඩා කර ඇති අතර, මෙයින් සැලකිය යුතු ප්‍රමාණයක් රහස්‍ය ලේඛණ ද වේ. මෙවන් සුවිසල් භෞතික ලිපිගොනු ප්‍රමාණයක් සමඟ කටයුතු කිරීමට සිදුවීම, ආයතනයෙහි කාර්යක්ෂමතාව කෙරෙහි අහිතකර ලෙස බලපෑම් සිදුකල අතර, ඒ අනුව කාලය සහ ඉඩකඩ වැය වීම අවම කරලීම සඳහා ලිපිගොනු ඩිජිටල් කිරීමේ අවශ්‍යතාවයක් මතුවන ලදී.

ඒ අනුව සකස් කරන ලද, බුද්ධිමය දේපළ කාර්යාලයෙහි ලිපිගොනු පරිලෝකනය (Scan) කිරීමේ ව්‍යාපෘති යෝජනාවට, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය හිමිවිය. වසර දෙකක් තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණ මෙම ව්‍යාපෘතිය, රුපියල් මිලියන 90ක වටිනාකමක් සහිත විය. එයින්, රු. මිලියන 70.2ක් ලෝක බුද්ධිමය දේපළ සංවිධානයෙහි (WIPO) තාක්ෂණික සහ සේවා ප්‍රදානයක් වූ අතර, ඉතිරිය වූ රු. මිලියන 19.8ක් බුද්ධිමය දේපළ අරමුදල මගින් දැරීමට යෝජිතය. අනුමත ව්‍යාපෘති යෝජනාවට අනුව, ලෝක බුද්ධිමය දේපළ සංවිධානය

විසින් තෝරාගනු ලබන සේවා සපයන්නකු හරහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය තුළ, එම සේවා සපයන ආයතනය වෙත අදාළ කාර්යය ඉටුකිරීමට අවශ්‍ය පහසුකම් සැපයීමට සැලසුම් කර තිබුණි.

ලිපිගොනු පරිලෝකණය කිරීම සඳහා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු ලෝක බුද්ධිමය දේපළ සංවිධානය විසින් වසර මැද වන විට අවසන් කල අතර, ඒ අනුව, 2024 හි තුන්වන කාර්තුව වන විට, නියමු ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතියෙහි මූලික කටයුතු ආරම්භ කිරීමට ද හැකියාව ලැබිණි.

# 2

## දෙවන පරිච්ඡේදය



- ## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

මූල්‍ය ප්‍රගතිය 2024

2.1 වෙළඳ ලකුණු ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

2.2 පේටන්ට් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

2.3 කාර්මික සැලසුම් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

2.4 විශේෂ ජයග්‍රහණ

2.5 අභියෝග

2.6 ඉදිරි ඉලක්ක

## මූල්‍ය ප්‍රගතිය - 2024

### ආදායම

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ **2024.12.31** දිනට මුළු ආදායම රු.මි.**308.3** කි. ඉන් **57.22 %** ක් බුද්ධිමය දේපළ අරමුදලේ ආදායම් අතිරික්තය ආයෝජනය කිරීමෙන් ලද පොලී මගින් රැස්කළ ආදායම වන අතර, ඉතිරි **42.78 %** බුද්ධිමය දේපළ පනත යටතේ වන ගාස්තු අය කිරීම් මගින් ලද ආදායම වේ.

බුද්ධිමය දේපළ පනතේ විධිවිධාන පරිදි, බුද්ධිමය දේපළ පනත යටතේ උපයනු ලබන ආදායම් වලින් **1/3**ක කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර, **2024.12.31** දින වන විට එකී වර්ෂය සඳහා එසේ බැර කළ මුදල රු.මි.**43.96** කි.

**ප්‍රස්තාරය 1 : 2024.12.31 දිනට සමස්ත ආදායම (රු.මිලි.)**




*මූලාශ්‍ර - ගිණුම් අංශයෙහි වාර්තා*

### වියදම

බුද්ධිමය දේපළ අරමුදල පරිපාලන කිරීමේ කටයුතු වෙනුවෙන් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ නිලධාරීන්ගේ පුද්ගල පඩි නඩි හා වැටුප් ගෙවීම් සඳහා ශීර්ෂ අංක **299** යටතේ රජය විසින් රු.මි **59.7** ක ප්‍රතිපාදන දරා ඇත. ඉතිරි සියලු වියදම් බුද්ධිමය දේපළ අරමුදල විසින් දරා ඇත. **2024.12.31** දිනට බුද්ධිමය දේපළ අරමුදලෙන් වැය කර ඇති සමස්ත මුදල රු.මි. **78.65** කි.

**ප්‍රස්ථාරය 2 : 2024.12.31 දිනට අරමුදලෙහි සමස්ත වියදම (රු.මිලි.)**




*මූලාශ්‍ර - ගිණුම් අංශයෙහි වාර්තා*

## 2.1 වෙළඳ ලකුණු ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

**වගුව - 1 : 2024.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ ලකුණු ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය**

| ක්‍රියාකාරකම් | | ඉටු කරන ලද කාර්ය | | |
|---|---|---|---|---|
| | | ඉලක්කය (සංඛ්‍යාත්මකව) | සත්‍ය අගය (සංඛ්‍යාත්මකව) | % |
| 1 | වෙළඳ ලකුණු අයදුම්පත් ලැබීම් | 10430 | 12379 | 118.7% |
| 2 | වෙළඳ ලකුණු පරීක්ෂා කිරීම් | 11100 | 15547 | 140.1% |
| 3 | ලකුණු පිළිගැනීම සහ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව ලිපි නිකුත් කිරීම් | 11100 | 14681 | 132.3% |
| 4 | වෙළඳ ලකුණු සම්බන්ධ නිවේදන රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම් | 8958 | 7475 | 83.4% |
| 5 | වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම් | 8622 | 7240 | 84.0% |
| 6 | වෙළඳ ලකුණු ලියාපදිංචිය අලුත් කිරීම් | 5299 | 7018 | 132.4% |
| 7 | වෙළඳ ලකුණු පැවරුම් සටහන් කිරීම් | 1423 | 1472 | 103.4% |
| 8 | නම/ලිපිනය සිදු වන වෙනස් වීම් සටහන් කිරීම | 2557 | 1801 | 70.4% |

*මූලාශ්‍ර - වෙළඳ ලකුණු අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2024 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම*

වගුව අංක 1 මගින්, 2024 වසරෙහි වෙළඳ ලකුණු ආශ්‍රිත ක්‍රියාකාරකම් වල ප්‍රගතිය පෙන්නුම් කරයි.

ඒ අනුව අපේක්ෂිත අයදුම්පත් ලැබීම් 12,379ක් පෙන්නුම් කරන අතර, එය ඉලක්ක ගත සංඛ්‍යාවට වඩා 18%ක වර්ධනයකි. වෙළඳ ලකුණු පරීක්ෂා කිරීම් ද එහි ඉලක්කගත අගය අභිබවා 40%ක වර්ධනයක් පෙන්නුම් කරන අතර, වෙළඳ ලකුණු පිළිගැනීම් හා ප්‍රතික්ෂේප කිරීම් ද ඉලක්ක අභිබවා යමින් 32%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

පසුගිය 2023 වසරට සාපේක්ෂව, ගතවූ 2024 වසර සඳහා, වාර්ෂික ඉලක්ක ඉහල දැමීමක් සිදුකරන ලද අතර, එසේ ඉහළ නංවන ලද ඉලක්ක සමඟ කටයුතු කර, සියළුම ක්‍රියාකාරකම් සඳහා 70%කට වඩා වැඩි ප්‍රගතියක් පෙන්නුම් කිරීම තුළින්, වෙළඳ ලකුණු අංශය 2024 වර්ෂයේ දී, ඉහළ ප්‍රගතියක් අත්කරගෙන ඇති බවට නිගමනය කළ හැකිය.

## වෙළඳ ලකුණු අයදුම්පත් ලැබීම

**වගුව - 2 - එක් එක් වර්ෂ අනුව ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව**

| වර්ෂය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| වෙළඳ ලකුණු අයදුම්පත් ලැබීම | 9593 | 9947 | 9466 | 11109 | 12379 |

මූලාශ්‍ර-වෙළඳ ලකුණු අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව

**ප්‍රස්තාරය - 3 - එක් එක් වර්ෂ අනුව ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව**




මූලාශ්‍ර- වෙළඳ ලකුණු අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව

වගුව 2 හා ප්‍රස්තාරය 3 මගින් 2020 සිට 2024 දක්වා වර්ෂවල ලැබී ඇති වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව පෙන්නුම් කරයි.

2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රටෙහි පැවති අහිතකර සමාජ ආර්ථික වටපිටාව සහ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් යම් අවස්ථාවල කාර්යාලය වසා තැබීමත්, මාර්ගගත ක්‍රමයට අයදුම්පත් ලබා ගැනීමට සිදුවීමත්, සමස්ත ආර්ථිකයෙහි සිදුවූ සංකෝචනයත් හේතුවෙන් එම කාලසීමාව තුළ අයදුම්පත් ලැබීම් සැලකිය යුතු ප්‍රමාණයකින් පහළ යාම සිදු විය.

ඒ අනුව, 2022 වසරේ දී අයදුම්පත් ලැබීමේ අවම සංඛ්‍යාව පෙන්නුම් කරන අතර එතැන් සිට 2024 දක්වා අයදුම්පත් ලැබීමේ ක්‍රමික වර්ධනයක් නිරීක්ෂණය වේ. රට යළි සාමාන්‍ය තත්ත්වයට පත් වීමෙන් පසු අයදුම්පත් කාර්යාලය තුළ දී භාර ගැනීම නැවත ආරම්භ කිරීම හා තොරතුරු කවුළුව නැවත මහජනතාවට විවෘත කිරීම මගින් අයදුම් පත් ලැබීම්වල යම් ඉහළ යාමක් සිදු වූ අතර, සමස්ත ආර්ථිකයෙහි සිදුවූ ප්‍රසාරණයට සමගාමීව අයදුම් පත් ලැබීම් අඛණ්ඩව වර්ධනය වී ඇති බව උපකල්පනය කල හැකිය.

ඒ අනුව, රට තුළ පවතින සමාජීය හා ආර්ථික බලපෑම් බුද්ධිමය දේපළ විෂය කෙරෙහි සෘජු ලෙස බලපෑම් ඇති කරන බව සහ 2024 වන විට රටෙහි ආර්ථිකයෙහි සාධනීය ප්‍රවනතා වර්ධනය වෙමින් පවතින බව නිගමනය කල හැකි ය.

## වෙළඳ ලකුණු අයදුම්පත් පරීක්ෂා කිරීම

**වගුව - 3- ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත් වලට සාපේක්ෂව පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව**

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව | 9593 | 9947 | 9466 | 11109 | 12379 |
| පරීක්ෂා කළ අයදුම්පත් සංඛ්‍යාව | 12551 | 4989 | 6414 | 9087 | 15547 |

මූලාශ්‍ර-වෙළඳ ලකුණු අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව

**ප්‍රස්තාරය - 4- ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත් වලට සාපේක්ෂව පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව**




මූලාශ්‍ර-වෙළඳ ලකුණු අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව

වගුව 3 හා ප්‍රස්තාරය 4 මගින් 2020 සිට 2024 වර්ෂය දක්වා වාර්ෂිකව ලැබී ඇති වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව හා වාර්ෂිකව පරීක්ෂා කළ අයදුම්පත් සංඛ්‍යාව අතර සංසන්දනයක් පෙන්නුම් කරයි.

ඒ අනුව, 2021 වර්ෂයේ සිට අයදුම්පත් ලැබීම් වලට සාපේක්ෂව පරීක්ෂා කිරීම් අඩු මට්ටමක පැවතුන ද, එතැන් සිට පරීක්ෂා කිරීම් සංඛ්‍යාවෙහි ක්‍රමික වර්ධනයක් නිරීක්ෂණය වේ. එසේම, 2024 වර්ෂය වන විට ප්‍රවර්තන වර්ෂයෙහි අයදුම්පත් සංඛ්‍යාව අභිබවමින්, පරීක්ෂා කිරීම් සංඛ්‍යාව ඉහළ නංවා ගැනීමට වෙළඳ ලකුණු අංශය සමත් වී ඇති බව පෙන්නුම් කරයි .

ලියාපදිංචි කිරීම සඳහා පද්ධතියට එකතු වන වෙළඳ ලකුණු ප්‍රමාණය වසරක් පාසා වැඩි වීම තුළින් වෙළඳ ලකුණු පරීක්ෂා කිරීමේ කාර්යය ද වසරක් පාසා සංකීර්ණත්වයෙන් ඉහල යයි. එවන් පසුබිමක, වෙළඳ ලකුණු පරීක්ෂා කිරීම ප්‍රමාණය ක්‍රමිකව ඉහළ යාම, එම අංශයේ ප්‍රගතියෙහි සිදු වූ කැපී පෙනෙන වර්ධනයක් ලෙස සැලකිය හැකි ය. ඒ අනුව, අංශයේ අනෙකුත් ක්‍රියාකාරකම් අතුරින් වෙළඳ ලකුණු පරීක්ෂා කිරීම සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දීමත්, නිලධාරීන් සඳහා ඉලක්ක ලබා දීමත් තුළින් මෙසේ ඉහළ ප්‍රගතියක් අත්කර ගැනීමට හැකි වී ඇති බව නිගමනය කළ හැකි ය.

## වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම

**වගුව - 4 : ලියාපදිංචි කළ වෙළඳ ලකුණු දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය කිරීම**

| වර්ෂය | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|
| දේශීය | 2734 | 1850 | 2128 | 3761 |
| විදේශීය | 2729 | 1792 | 1635 | 3479 |

*මූලාශ්‍ර - වෙළඳ ලකුණු අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව*

**ප්‍රස්තාරය - 5 : ලියාපදිංචි කළ වෙළඳ ලකුණු දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය කිරීම**




*මූලාශ්‍ර - වෙළඳ ලකුණු අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව*

වගුව 4 හා ප්‍රස්තාරය 5 මගින් 2021 සිට 2023 වර්ෂය දක්වා ලියාපදිංචි කළ වෙළඳ ලකුණු සංඛ්‍යාව දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය කර පෙන්නුම් කරනු ලබයි.

ඒ අනුව 2021 සිට 2023 දක්වා කාල පරාසය තුළ, කලින් වසර වලට සාපේක්ෂව ලියාපදිංචි කරන ලද විදේශීය ලකුණු සංඛ්‍යාවෙහි මද පසුබෑමක් නිරීක්ෂණය වන නමුදු, 2024 දී එම තත්ත්වය වෙනස් වී තිබේ.

බුද්ධිමය දේපළ පනතේ විධි විධාන ප්‍රකාරව වෙළෙඳ ලකුණක් වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පතක් එය ලියාපදිංචි කිරීම දක්වා වූ සංකීර්ණ ක්‍රියාවලියකට භාජනය වන බැවින් අයදුම්පත ලද වර්ෂයේම ලියාපදිංචිය සිදු නොවිය හැකි ය. ඒ අනුව යම් වසරක් තුළ සිදුවන ලියාපදිංචි කිරීම්, අනුයාත වසර කිහිපයක අයදුම්පත් වල සංයුතියක් විය හැකි අතර, එමගින් සමස්ත ආර්ථිකයෙහි පවතින ප්‍රවනතා පිළිබඳ ව යම් අදහසක් ඇතිකර ගත හැකිය.

ඒ අනුව, විදෙස් ආයෝජකයන් ගේ මැදිහත්වීම ඉහළ ගොස් ඇති බවත්, 2024 වන විට රටෙහි ආර්ථිකයෙහි සාධනීය ප්‍රවනතා වර්ධනය වෙමින් පවතින බවත්, ඒ සඳහා වෙළඳ ලකුණු අංශය ප්‍රමුඛ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය මගින් සාධනීය මැදිහත් වීමක් සිදුකරමින් පවතින බවත් නිගමනය කල හැකි ය.

## 2.2 පේටන්ට් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

**වගුව - 5 : 2024.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා පේටන්ට් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය**

| ක්‍රියාකාරකම් | | භෞතික ප්‍රගතිය (ඉටු කරන ලද කාර්ය) | | |
|---|---|---|---|---|
| | | ඉලක්කය (සංඛ්‍යාත්මකව) | සත්‍ය අගය (සංඛ්‍යාත්මකව) | % |
| 1 | පේටන්ට් අයදුම්පත් ලැබීම් | 450 | 434 | 96.4% |
| 2 | අයදුම්පත් හා සම්බන්ධ මූලික පරීක්ෂාව (දේශීය / ජාත්‍යන්තර / පේටන්ට් සහයෝගිතා ගිවිසුම (PCT) යටතේ ගොනු කළ අයදුම්පත්) | 450 | 712 | 158.2% |
| 3 | නවතාවය පිළිබඳ පරීක්ෂා කිරීම් (අයදුම්පත පේටන්ට් බලපත්‍රයක් ලබාදීමේ දී සපුරාලිය යුතු අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්දැයි සඳහා පරීක්ෂාව) | 1200 | 565 | 47.1% |
| 4 | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා ජර්නල් සැකසීම | 12 | 11 | 91.7% |
| 5 | පේටන්ට් සම්බන්ධ නිවේදන රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම | 200 | 156 | 78.0% |
| 6 | පේටන්ට් සහතික සකස් කිරීම | 200 | 187 | 93.5% |
| 7 | ලියාපදිංචිය අලුත් කළ අයදුම්පත් සංඛ්‍යාව | 480 | 849 | 176.9% |
| 8 | පොදු මහජනතාව සඳහා තොරතුරු සැපයීම/ දේශීය දත්ත සමුදායන් වෙත ප්‍රවේශ වී තොරතුරු ලබා ගැනීම | 250 | 789 | 315.6% |

*මූලාශ්‍ර - පේටන්ට් අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2024 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම*

වගුව 5 මගින් 2024 වර්ෂයේ දී පේටන්ට් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පෙන්නුම් කරයි.

ඒ අනුව අපේක්ෂිත පේටන්ට් අයදුම්පත් ලැබීම් වලින් 96% ක අයදුම්පත් සංඛ්‍යාවක් 2024 වර්ෂය තුළ ලැබී ඇති බව නිරීක්ෂණය වේ. එසේම, නවතාවය පිළිබඳ පරීක්ෂා කිරීම හැරෙන්නට, පේටන්ට් අංශයේ අනෙක් සියළුම ක්‍රියාකාරකම් අපේක්ෂිත ඉලක්කයන්ගෙන් 75%කට වඩා ඉහළ මට්ටමකට පවත්වා ගැනීමට 2024 වසරේ දී හැකියාව ලැබී තිබේ.

ඒ අනුව පේටන්ට් පරීක්ෂකවරුන් දස දෙනෙකුගේ පුරප්පාඩු සහිත අවස්තාවක් වුව ද, පේටන්ට් අංශය 2024 වසරේ දී සාධනීය ප්‍රගතියක් අත්කරගෙන ඇති බව නිගමනය කල හැකි ය.

## පේටන්ට් අයදුම්පත් ලැබීම

**වගුව - 6 : එක් එක් වර්ෂ අනුව ගොනු කළ පේටන්ට් අයදුම්පත් ප්‍රමාණය**

| වර්ෂය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| පේටන්ට් අයදුම්පත් ලැබීම | 603 | 509 | 431 | 417 | 434 |

*මූලාශ්‍ර - පේටන්ට් අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව*

**ප්‍රස්තාරය - 6 : එක් එක් වර්ෂ අනුව ගොනු කළ පේටන්ට් අයදුම්පත් ප්‍රමාණය**




*මූලාශ්‍ර - පේටන්ට් අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව*

වගුව - 6 හා ප්‍රස්තාරය 6 මගින් 2020 සිට 2024 වර්ෂය දක්වා වාර්ෂිකව ගොනු කළ පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව පෙන්නුම් කරයි.

ඒ අනුව, 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාල පරාසය තුළ පේටන්ට් අයදුම්පත් ලැබීම් සංඛ්‍යාවෙහි ක්‍රමික පසුබෑමක් නිරීක්ෂණය වන නමුදු, 2024 වසර තුළ යම් වර්ධනයක් පෙන්නුම් කරයි. වාර්ෂිකව ගොනු කරනු ලබන පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව ප්‍රමාණාත්මකව ඉහළ යාම, කිසියම් රටක ආර්ථික වර්ධනයෙහි සාධනීය ලක්ෂණයක් වන බැවින්, දිවයිනෙහි හි මෙතෙක් පැවති දැඩි ආර්ථික පසුබෑම, ක්‍රමානුකූලව පහව යාමක් ඉදිරියේ දී අපේක්ෂා කළ හැකි ය.

## පේටන්ට් අයදුම්පත් පරීක්ෂා කිරීම

**වගුව - 7 : පේටන්ට් අයදුම්පත් ලැබීම් හා පරීක්ෂා කිරීම් සංඛ්‍යාව**

| | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|
| ලැබුණු පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව | 9593 | 9947 | 9466 | 11109 | 12379 | 12379 |
| පරීක්ෂා කළ අයදුම්පත් සංඛ්‍යාව | 12551 | 4989 | 6414 | 9087 | 15547 | 15547 |

මූලාශ්‍ර - පේටන්ට් අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව

**ප්‍රස්තාරය - 7 : ලැබුණු පේටන්ට් අයදුම්පත් වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව**




*මූලාශ්‍ර - පේටන්ට් අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව*

වගුව - 7 හා ප්‍රස්තාරය - 7 මගින් 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ලැබී ඇති පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව හා පරීක්ෂා කළ අයදුම්පත් සංඛ්‍යාව පෙන්නුම් කරයි.

එහිදී 2022 වර්ෂයේ සිට, පරීක්ෂා කිරීම් සංඛ්‍යාවෙහි වාර්ෂිකව පසුබෑමක් නිරීක්ෂණය වන අතර , පේටන්ට් හා කාර්මික සැලසුම් අංශයෙහි මානව සම්පත් හිඟතාව මෙම තත්වය උද්ගතවීම සඳහා හේතු වී ඇති බවට උපකල්පනය කල හැකි ය.

කෙසේ වුවද, ඉහත ප්‍රස්තාරය මඟින් 2019 වර්ෂයේ සිට ප්‍රවර්තන වර්ෂය දක්වා වාර්ෂිකව ලැබෙන අයදුම්පත් සංඛ්‍යාවට සාපේක්ෂව ඉහළ පරීක්ෂා කිරීම් සංඛ්‍යාවක් සිදු කර ඇති බව පෙන්නුම් කරන අතර, ඒ මගින් පසුගිය වසර වල පරීක්ෂා කිරීම සඳහා අතපසු වූ කාර්යයන් ප්‍රමාණය අඩු කර ගනිමින්, කාර්යක්ෂම සේවාවක් ලබා දීමට මෙම අංශයට 2024 වසර තුළදී ද හැකිවී ඇති බවට නිගමනය කළ හැකි ය.

පේටන්ට් පරීක්ෂක වරු 10 දෙනකු එළඹෙන වසර තුළදී බඳවා ගැනීමට නියමිත බැවින්, ඉදිරි වර්ෂ වලදී උක්ත අතපසු වූ කාර්යයන් පහසුවෙන් යථාවත් කර ගැනීමට, පේටන්ට් හා කාර්මික සැලසුම් අංශයට හැකියාව ලැබෙනු ඇත.

## පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීම්

**වගුව - 8 : පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීම් සංඛ්‍යාව දේශීය විදේශීය වශයෙන් වර්ගීකරණය**

| වර්ෂය | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|
| දේශීය | 66 | 80 | 59 | 40 |
| විදේශීය | 128 | 109 | 141 | 147 |

*මූලාශ්‍ර - පේටන්ට් අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව*

**ප්‍රස්තාරය - 8 : පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීම් සංඛ්‍යාව දේශීය විදේශීය වශයෙන් වර්ගීකරණය**




*මූලාශ්‍ර - පේටන්ට් අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව*

වගුව - 8 හා ප්‍රස්තාරය - 8 මඟින් 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ප්‍රදානය කළ පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව පෙන්නුම් කරයි.

ඒ අනුව පසුගිය වර්ෂ දෙකට සාපේක්ෂව 2024 වර්ෂයේ දී ප්‍රදානය කරන ලද සමස්ත පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාවෙහි සුළු පසුබෑමක් පෙන්නුම් කරනා අතර, එම පසුබෑම හුදෙක් දේශීය අයදුම්පත් සම්බන්ධයෙන් පමණක් නිරීක්ෂණය වේ. බුද්ධිමය දේපළ පනතේ විධි විධාන ප්‍රකාරව පේටන්ට් බලපත්‍රයක් වෙනුවෙන් ගොනු කරනු ලබන පේටන්ට් අයදුම්පතක්, එය ලියාපදිංචි කිරීම දක්වා වූ සංකීර්ණ ක්‍රියාවලියකට භාජනය වන බැවින්, අයදුම්පත ලද වර්ෂයේම ලියාපදිංචිය සිදු නොවිය හැකි ය.

2024 වසර තුළ ප්‍රදානය කරන ලද මුළු පේටන්ට් බලපත්‍ර ප්‍රමාණය 187ක් වන අතර, ඉන් 40ක්[1] පමණක් දේශීය අයදුම්පත් වේ.

[1] යථෝක්ත 2024 වසර තුල දේශීය පේටන්ට් අයදුම්පත් 250 ක් ලැබී ඇති අතර, පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කිරීම ට ඇති හැකියාව පරීක්ෂා කෙරෙන නවතාවය, නව නිපැයුම් කාරී පියවර සහ කාර්මික වශයෙන් යොදා ගැනීම යන අවශ්‍යතා පරීක්ෂා කෙරෙන පරීක්ෂාවන් 265 ක් සිදුකර ඇත. ඒ අනුව එම පරීක්ෂා 265 තුල අයදුම්පත් 233ක් ම දෝෂ සහිත බව ට හඳුනාගෙන ඇති බව නිරීක්ෂණය විය.

## 2.3 කාර්මික සැලසුම් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

**වගුව - 9 : 2024.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා කාර්මික සැලසුම් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය**

| ක්‍රියාකාරකම් | | ඉටු කරන ලද කාර්යය | | |
|---|---|---|---|---|
| | | ඉලක්කය (සංඛ්‍යාත්මකව) | සත්‍ය අගය (සංඛ්‍යාත්මකව) | % |
| 1 | කාර්මික සැලසුම් අයදුම්පත් ලැබීම් | 150 | 213 | 142.0% |
| 2 | අයදුම්පත් හා සම්බන්ධ මූලික පරීක්ෂාව (දේශීය / ජාත්‍යන්තර අයදුම්පත්) | 150 | 262 | 174.7% |
| 3 | අයදුම්පත්වල සෝදිසි පරීක්ෂාව (කාර්මික සැලසුම් ලියාපදිංචිය සඳහා සපුරා ලිය යුතු අවශ්‍යතා සම්පූර්ණ කර ඇද්දැයි පරීක්ෂා කිරීම) | 150 | 131 | 87.3% |
| 4 | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා ජර්නල් සැකසීම | 4 | 3 | 75.0% |
| 5 | කාර්මික සැලසුම් සම්බන්ධ නිවේදන රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම | 75 | 75 | 100.0% |
| 6 | කාර්මික සැලසුම් සඳහා සහතික පත් සැකසීම | 75 | 80 | 106.7% |
| 7 | ලියාපදිංචිය අලුත් කළ අයදුම්පත් සංඛ්‍යාව | 150 | 150 | 100.0% |
| 8 | පොදු මහජනතාව සඳහා තොරතුරු සැපයීම/ දේශීය දත්ත සමුදායන් වෙත ප්‍රවේශ වී තොරතුරු ලබා ගැනීම | 50 | 170 | 340.0% |

*මූලාශ්‍ර - පේටන්ට් හා කාර්මික සැලසුම් අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2024 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම*

වගුව 9 මගින් 2024 වර්ෂයේ දී කාර්මික සැලසුම් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පෙන්නුම් කරයි.

ඒ අනුව 2024 වසරේ දී අයදුම්පත් වල සෝදිසි පරික්ෂාව සහ ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා ජ'නල සැකසීම යන ක්‍රියාකාරකම් සඳහා අදාළ ඉලක්කයන් ගෙන්, පිළිවෙළින් 87%ක් හා 75%ක් යන ප්‍රගතීන් අත්කරගෙන ඇති අතර, අනෙකුත් සියළුම ක්‍රියාකාරකම් සඳහා අපේක්ෂිත ඉලක්ක අභිබවා ප්‍රගතිය අත්කරගෙන ඇති බව නිරීක්ෂණය වේ.

## කාර්මික සැලසුම් අයදුම්පත් ලැබීම්

**වගුව - 10 : එක් එක් වර්ෂ අනුව ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව**

| වර්ෂය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| වෙළඳ ලකුණු අයදුම්පත් ලැබීම් | 281 | 139 | 159 | 165 | 213 |

*මූලාශ්‍ර - පේටන්ට් හා කාර්මික සැලසුම් අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව*

**ප්‍රස්තාරය -9 : කාර්මික සැලසුම් අයදුම්පත් ලැබීම්**




*මූලාශ්‍ර - පේටන්ට් හා කාර්මික සැලසුම් අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව*

වගුව 10 හා ප්‍රස්තාරය 9 මගින් 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වාර්ෂිකව ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව පෙන්නුම් කරයි. එහිදී, 2020 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාර්මික සැලසුම් අයදුම්පත් ලැබීම් වල සීඝ්‍ර පසුබෑමක් නිරීක්ෂණය වන අතර, 2021 වර්ෂයෙන් පසු අයදුම්පත් ලැබීම් වල ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරයි.

මෙහිදී, 2020 වර්ෂයේ සිට 2022 වර්ෂයේ මුල් කාර්තුව වන තෙක් රට තුළ පැතිර ගිය කොවිඩ් වසංගතය සහ රටෙහි පැවති සාමාජීය අර්බුද, අයදුම්පත් ගොනු කිරීම් පහළ යාමට හේතුවක් වී ඇති බවට උපකල්පනය කලහොත්, රට තුළ පවතින සමාජීය හා ආර්ථික බලපෑම්, නව නිර්මාණ අංශයට සෘජුව බලපෑමක් ඇති කරන බව සහ 2024 වන විට රටෙහි ආර්ථිකයෙහි සාධනීය ප්‍රවනතාවක් වර්ධනය වෙමින් පවතින බව, නිගමනය කල හැකිය.

## කාර්මික සැලසුම් අයදුම්පත් පරීක්ෂාව කිරීම්

**වගුව - 11: ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව පරීක්ෂා කරන ලද අයදුම්පත් සංඛ්‍යාව**

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| ලැබුණු පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව | 281 | 139 | 159 | 165 | 213 |
| පරීක්ෂා කළ අයදුම්පත් සංඛ්‍යාව | 288 | 164 | 151 | 131 | 131 |

*මූලාශ්‍ර - පේටන්ට් හා කාර්මික සැලසුම් අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව*

**ප්‍රස්තාරය - 10 : ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව**




*මූලාශ්‍ර - පේටන්ට් හා කාර්මික සැලසුම් අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව*

වගුව 11 සහ ප්‍රස්තාරය 10 මගින් 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ලැබී ඇති කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව සහ පරීක්ෂා කරන ලද කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව පෙන්නුම් කරයි.

ඒ අනුව, වාර්ෂිකව ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව 2021 වසරේ සිට ක්‍රමයෙන් වර්ධනය වන බව නිරීක්ෂණය වන නමුදු, ඒ හා සමගාමීව, පරීක්ෂා කිරීම් සංඛ්‍යාවෙහි වර්ධනයක් පෙන්නුම් නොකරයි. පේටන්ට් හා කාර්මික සැලසුම් අංශයෙහි වර්තමානයේ මුහුණ දී ඇති උග්‍ර මානව සම්පත් හිඟතාව මෙම තත්වය උද්ගතවීම සඳහා හේතුවී ඇති අතර, පරික්ෂාකිරීම් සංඛ්‍යාව තවදුරටත් පහල යා නොදී, පෙර වසරෙහි තත්වයෙන්ම හෝ පවත්වාගෙන යාමට හැකිවීම ද, එම අංශය ලද ජයග්‍රහණයක් ලෙස දැක්විය හැකි ය. පේටන්ට් පරීක්ෂකවරු 10 දෙනකු එලඹෙන වසර තුළදී බඳවා ගැනීමට නියමිත බැවින්, ඉදිරි වර්ෂ වලදී උක්ත පරීක්ෂාකිරීම් සංඛ්‍යාව පහසුවෙන් යථාවත් කර ගැනීමට, පේටන්ට් හා කාර්මික සැලසුම් අංශයට හැකියාව ලැබෙනු ඇත.

## කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම.

**වගුව - 12 : ලියාපදිංචි කළ කාර්මික සැලසුම් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය**

| වර්ෂය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| දේශීය | 122 | 54 | 74 | 127 | 48 |
| විදේශීය | 29 | 45 | 22 | 18 | 32 |

*මූලාශ්‍ර - ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව, පේටන්ට් හා කාර්මික සැලසුම් අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත*

**ප්‍රස්තාරය - 11 : ලියාපදිංචි කළ කාර්මික සැලසුම් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය**




*මූලාශ්‍ර - ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව, පේටන්ට් හා කාර්මික සැලසුම් අංශයෙන් ලබා ගත් සංඛ්‍යා දත්ත*

වගුව 12 හා ප්‍රස්තාරය 11 මඟින් 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ලියාපදිංචි කළ කාර්මික සැලසුම් සංඛ්‍යාව දේශීය හා විදේශීය වශයෙන් වෙන් කර පෙන්නුම් කරයි.

ඉහත ප්‍රස්තාරයට අනුව විදේශීය කාර්මික සැලසුම් වලට සාපේක්ෂව, දේශීය කාර්මික සැලසුම් වල ඉහළ ලියාපදිංචි වීමක් නිරීක්ෂණය වේ. කෙසේ වුව ද, 2024 වර්ෂයේ දී පෙර වසරට සාපේක්ෂව සමස්ත ලියාපදිංචිවීම් වල පසුබෑමක් නිරීක්ෂණය වුව ද, විදේශීය කාර්මික සැලසුම් ලියාපදිංචිවීම් වල පමණක් 77%ක කැපී පෙනෙන වර්ධනයක් නිරීක්ෂණය වේ. ඒ අනුව, විදෙස් ආයෝජකයන් ගේ මැදිහත්වීම ඉහල ගොස් ඇති බවත්, 2024 වන විට රටෙහි ආර්ථිකයෙහි සාධනීය ප්‍රවනතා වර්ධනය වෙමින් පවතින බවත්, ඒ සඳහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සාධනීය මැදිහත් වීමක් සිදුකරමින් පවතින බවත් නිගමනය කල හැකිය.

## 2.4 විශේෂ ජයග්‍රහණ

### 2.4.1 වෙළඳ ලකුණු අංශය

#### වෙළඳ ලකුණු ජාත්‍යන්තර ලියාපදිංචිය

වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමට අදාළව මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට අනුගත වීම සඳහා බුද්ධිමය දේපළ පනතට ඇතුළත් විය යුතු සංශෝධන, නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කර ඇති අතර, ඒ සඳහා ගරු නීති පති තුමාගේ නිරීක්ෂණ ද ලබා ගැනීමට ගත වූ වර්ෂය තුළ හැකි වී ඇත. මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට අනුගත වීම සම්බන්ධයෙන් නව රජයේ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු බවට, නීති කෙටුම්පත් සම්පාදක විසින් රේඛීය අමාත්‍යාංශය වෙත යෝජනා කර ඇති අතර, ඒ අනුව ඉදිරියේ දී, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලය වෙතින් අනුමැතිය ලබා ගැනීමට නියමිත ය.

#### භූගෝලීය දර්ශක

භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වන සංශෝධන, බුද්ධිමය දේපළ පනතට ඇතුළත් කර ඇති අතර, ලියාපදිංචි කිරීමට අදාල රෙගුලාසි විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත, ගැසට් මඟින් ප්‍රසිද්ධ කිරීමට ගත වූ වර්ෂය තුළ හැකි වී තිබේ. භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම ආරම්භ කිරීම පිළිබඳව මහජනතාවට දැනුම් දීම සඳහා පුවත්පත් හා වෙබ් අඩවි මඟින් දැන්වීම් ප්‍රසිද්ධ කර ඇත.

#### ලිපිගොනු ඩිජිටල්කරණය

බුද්ධිමය දේපළ ලේඛන ඩිජිටල්කරණය කිරීම සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානයෙන් (WIPO) ලබා දෙන තාක්ෂණික ප්‍රදානයක් අනුව, ලේඛන පරිලෝකනය සඳහා (Scanning) මූලික පියවර ආරම්භ කිරීමට ගත වූ වර්ෂය තුළ හැකි වී තිබේ. එම ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික සහය ලබා දීම සම්බන්ධයෙන් ලෝක බුද්ධිමය දේපළ සංවිධානය සමඟ අත්සන් කිරීමට නියමිත ද්වි පාර්ශවික අවබෝධතා ගිවිසුම් අවසාන නිර්දේශ සඳහා නීතිපති වෙත යොමු කර තිබේ. ඒ සම්බන්ධයෙන් වන කැබිනට් සංදේශය කෙටුම්පත් කර, රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

#### එක් රැස්ව ඇති රාජකාරි අවසන් කිරීම

වෙළඳ ලකුණු ශාඛාවේ එක් රැස්ව ඇති රාජකාරි අවසන් කිරීම සඳහා වසරක වැඩ සැලැස්මක් සකස් කර, රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර, එම වැඩ සැලැස්ම අනුව එක් රැස් වූ රාජකාරි නිම කිරීමට කටයුතු කරමින් පවතී.

## 2.4.2. පේටන්ට් අංශය

### පේටන්ට් බලපත්‍ර

ගතවූ 2024 වර්ෂය තුළ, පේටන්ට් බලපත්‍ර 187ක් ප්‍රදානය කිරීමට හැකි වී තිබේ. ඒ අතරින් ප්‍රදානය කරන ලද දේශීය පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව 40කි[2].

2024 වසර තුළ ප්‍රදානය කරන ලද දේශීය පේටන්ට් ප්‍රදාන 40 අතරින්, 2023 වසර සඳහා ලද අයදුම්පත් 2ක් ද, 2022 සඳහා 13ක් ද, 2021 සඳහා 6ක් ද, 2020 සඳහා 7ක් ද, 2019 සඳහා 7ක් ද, 2013 – 2018 කාලය සඳහා අයදුම්පත් 5ක් ද ලෙස වර්ගීකරණය කල හැකි ය.

තව ද 2024 වසර තුළ ප්‍රදානය කරන ලද එම පේටන්ට් ප්‍රදානයන් 40ක් අතරින්, ප්‍රදානයන් 18ක් (45.0 %) තනි පුද්ගලයින් වෙත ද, ප්‍රදානයන් 13ක් (32.5 %) රාජ්‍ය විශ්ව විද්‍යාල වෙත ද, ප්‍රදානයන් 9ක් (22.5 %) ආයතන වෙත ද පිරිනමා ඇත. 2024 වසර තුළ පේටන්ට් බලපත්‍ර අලුත් කිරීම් 849ක් ලියාපදිංචි කිරීම ද සිදු කර ඇත.

### කාර්මික සැලසුම්

ගතවූ 2024 වර්ෂයේ ලද කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව 213ක් වන අතර එය 2020 වර්ෂයෙන් පසුව ලද වැඩිම අයදුම්පත් සංඛ්‍යාව වේ. ඉන් 171ක් දේශීය අයදුම්පත් වන අතර, එය 2019 වර්ෂයෙන් පසු ලද වැඩිම දේශීය අයදුම්පත් සංඛ්‍යාව වේ.

2024 වසර තුළ ලියාපදිංචි කරන ලද මුලු කාර්මික සැලසුම් ප්‍රමාණය 80කි. ඉන් 48ක් දේශීය අයදුම්පත් වන අතර, 32ක් විදේශීය අයදුම්පත්වේ.

ගතවූ 2024 වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද කාර්මික සැලසුම් අලුත් කිරීම් සංඛ්‍යාව 150ක් වන අතර, අලුත් කිරීම් සඳහා අයදුම්පත් 133 ක් ඉදිරිපත් වී ඇත. ඒ අනුව, 2022 හා 2023 වසර දෙක හා සන්සන්දනයේ දී අලුත් කිරීම් සඳහා ඉදිරිපත් වූ අයදුම්පත් සංඛ්‍යාවේ සැලකිය යුතු වර්ධනයක් පෙන්වා ඇති බැවින්, කාර්මික සැලසුම් ලියාපදිංචිය අලුත් කිරීම සඳහා අයදුම්කරුවන්ගේ උනන්දුව වැඩිවී ඇති බව නිරීක්ෂණය වේ.

[2] යථෝක්ත 2024 වසර තුල දේශීය පේටන්ට් අයදුම්පත් 250 ක් ලැබී ඇති අතර පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කිරීම ට ඇති හැකියාව පරීක්ෂා කෙරෙන නවතාවය, නව නිපැයුම් කාරී පියවර සහ කාර්මික වශයෙන් යොදා ගැනීම යන අවශ්‍යතා පරීක්ෂා කෙරෙන පරීක්ෂාවන් 265 ක් සිදුකර ඇත. ඒ අනුව එම පරීක්ෂා 265 තුල අයදුම්පත් 233ක් ම දෝෂ සහිත බව ට හඳුනාගෙන ඇති බව නිරීක්ෂණය විය.

## 2.4.3. පොදු ජයග්‍රහණ

**හොඳම වාර්ෂික වාර්තාව සඳහා වූ තරඟාවලිය**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී වරුන්ගේ සංගමය මගින් පවත්වන ලද රාජ්‍ය අංශයෙහි 2023 හොඳම වාර්ෂික වාර්තාව සඳහා වූ තරඟාවලියේදී, දෙපාර්තමේන්තු කාණ්ඩය ඔස්සේ තරඟ කලො ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය ට අනුකූලතා සහතිකයක් දිනා ගැනීමට හැකි විය.

**සම්පත් දායකත්වය සැපයීම**

ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ නිලධාරීන් විසින් සම්පත් දායකත්වය සපයන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්,

- නව නිපැයුම් සහ නවෝත්පාදන සඳහා බුද්ධිමය දේපළ අයිතිය සුරක්ෂිත කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන්ගේ කොමිසම විසින් පාසැල් ගුරු භවතුන් පුහුණු කිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහන් වයඹ සහ මධ්‍යම පළාත් සඳහා සංවිධානය කරන ලද අතර, ඒ සඳහා සම්පත් දායකත්වය ලබා දී ඇත.

- ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය විසින් එම ආයතනයේ පර්යේෂණ නිලධාරීන් සඳහා සංවිධානය කරන ලද බුද්ධිමය දේපළ හා පේටන්ට් වාර්තා කෙටුම්පත් කරණය සම්බන්ධ එක් දින වැඩමුළුව සඳහා 2024 ජුනි 18 දින සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

- ගම්පහ බණ්ඩාරණායක විද්‍යාලය විසින් සංවිධානය කරන ලද " x ban " 2024 අධ්‍යාපන, විද්‍යා, තාක්ෂණ හා වෙළෙඳ ප්‍රදර්ශනයේ බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් පාසල් සිසුන් දැනුවත් කිරීමේ තොරතුරු කවුළුවක් 2024 ජූලි 27 හා 28 දිනවල බුද්ධිමය දේපළ කාර්යාලය විසින් පවත්වන ලදී.

- ඉංජිනේරු ක්ෂේත්‍රයේ නව නිපැයුම් සඳහා පේටන්ට් ආරක්ෂාව ලබාගැනීම දිරිගැන්වීම සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් ඒකාබද්ධව සංවිධානය කරන ලද "Techno 2024" ප්‍රදර්ශනයේ පේටන්ට් සම්බන්ධ දැනුවත් කිරීමේ හා තොරතුරු ලබාදීමේ කවුළුවක් පවත්වාගෙන යාම 2024 ඔක්තොම්බර් මස 11, 12 හා 13 දින වල දී සිදු කරන ලදී.

- ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන්ගේ ඉල්ලීම පරිදි එම කොමිසමේ කාර්ය මණ්ඩලය බුද්ධිමය දේපළ, නව නිර්මාණ සහ පේටන්ට් බලපත්‍ර සම්බන්ධව පුහුණු කිරීමේ වැඩමුළුවක් 2024 අගෝස්තු 15 හා 16 දෙදින පේටන්ට් හා වෙළඳ ලකුණු අංශයේ කාර්ය මණ්ඩලයේ සම්පත් දායකත්වයෙන් සංවිධානය කරන ලදී.

- නව නිපැයුම් සහ නවෝත්පාදන සඳහා බුද්ධිමය දේපළ අයිතිය සුරක්ෂිත කිරීම වෙනුවෙන් නව නිපැයුම් කරුවන්ගේ පේටන්ට් සම්බන්ධ ගැටලු නිරාකරණය

කිරීමේ සාකච්ජාවකට 2024 නොවැම්බර් 26 දින සම්පත් දායකත්වය සපයා ඇත.

## 2.5 අභියෝග

- 200,000කට ආසන්න ක්‍රියාකාරී වෙළඳ ලකුණු ලිපිගොනු පවතින අතර 60,000කට ආසන්න ගොනු වසා දමා එක් රැස්ව පවතී.



ක්‍රියාකාරී ගොනු එදිනෙදා රාජකාරි සඳහා ප්‍රවේශ විය හැකි පරිදි අසුරා තැබිය හැකි ලේඛනාගාරයක අවශ්‍යතාවය පවතී. ඉවත් කිරීමට තීරණය කර මලුවල බහා ඇති 60,000ක් පමණ ගොනු ගබඩා කිරීමට සුදුසු අවකාශයක් ද සොයා ගත යුතුව ඇත. වර්තමානයේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය කුලී පදනම මත ස්ථානගතව පවතින සමාගම් මැඳුර ගොඩනැගිල්ල තුළ අවකාශ තව දුරටත් පුළුල් කල නොහැකි බැවින්, ඉහත ගබඩා ඉඩකඩ සපුරා ගැනීම අභියෝගයකි.

- වෙළඳ ලකුණු අංශයෙහි, 200,000කට අධික ක්‍රියාකාරී වෙළඳ ලකුණු වල රාජකාරි ඉටු කිරීම සඳහා, යොදවා ඇත්තේ 18 දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයක් පමණි. ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම මත, වෙළඳ ලකුණු සම්බන්ධ රාජකාරි වලට අතිරේකව, වෙළඳ ලකුණු ජාත්‍යන්තර ලියාපදිංචිය, ප්‍රකාශන හිමිකම්, භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම, බුද්ධිමය දේපළ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, විගණන කටයුතු සඳහා තොරතුරු හා සංඛ්‍යා ලේඛන හා

අනෙකුත් සංඛ්‍යා ලේඛන වාර්තා ලබා ගැනීමට ද එම නිලධාරින්වම යෙදවීමට සිදුව තිබේ. කාර්යක්ෂම හා යාවත්කාලින කරන ලද මහජන සේවයක් සැපයීම සඳහා ඉඩ පහසුකම් සහිත රාජකාරි පරිසරයක් සහ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ලබා ගැනීම අභියෝගය කි.

- ජාත්‍යන්තරව භාවිතා වන බුද්ධිමය දේපළ පරිපාලනය සම්බන්ධයෙන් වූ නව්‍යකරණයන් ( E- Filing, E - Scanning වැනි ) සමඟ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය ද ගමන් කල යුතුව ඇත. ඒ සඳහා මෙම කාර්යාලයේ තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් වන යටිතල පහසුකම් තව දුරටත් සංවර්ධනය විය යුතුව තිබේ. ලෝක බුද්ධිමය දේපළ සංවිධානයෙහි පිරිවිතරයන්ට අනුකූලව, සහ දේශීය තත්වයන්ට සහ මාර්ගෝපදේශයන්ට අනුකූල වන ලෙස, එකී යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනීම අභියෝගය කි.

- ආසන්න වසර කීපය තුළ රටෙහි පවතින දැඩි ආර්ථික පසුබෑම හේතුවෙන් 2024 වසර තුළ පේටන්ට් අයදුම්පත් ගොනු කිරීම ද සාපේක්ෂ ලෙස අඩු වී ඇත. එසේම, 2023 වසර තුළ ප්‍රදානය කළ පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව හා සැසඳීමේ දී 2024 වසර තුළ පේටන්ට් ප්‍රදානයන් ද අඩු වී ඇත. පේටන්ට් අයදුම්පත්වල ද්වීතීයක පරීක්ෂාවන් (නවතාවය පිළිබඳ පරීක්ෂාව) 565ක් අතරින් පරීක්ෂාවන් 401ක් ප්‍රතික්ෂේපිත හෝ දෝෂ සහිත බවට හඳුනාගත් අයදුම්පත් වේ. ඒ අනුව, සාර්ථක ලෙස පේටන්ට් අයදුම්පත් ගොනු කරවා ගැනීමත්, වාර්ෂික ව ප්‍රදානය කරනු ලබන පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව වර්ධනය කර ගැනීමත් අභියෝගය කි.

- අනුමත කාර්ය මණ්ඩලයෙහි හිඟතාව හේතුවෙන් අභ්‍යාසලාභීන් සැලකිය යුතු සංඛ්‍යාවක ගේ සේවය, තොරතුරු තාක්ෂණ අංශය වෙත ලබා ගැනීම සිදුවේ. ඔවුන්ගේ පුහුණු කාලය අවසන්වූ විට අප ආයතනය හැර යාම සිදුවන බැවින්, සය මසකට වරක් අලුත් කණ්ඩායමක් පුහුණු කිරීම ට සිදු වේ. තොරතුරු තාක්ෂණ අංශය වෙත පුරප්පාඩු සපුරා, අනුමත කාර්යමණ්ඩලය බඳවා ගැනීම අභියෝගය කි.

## 2.6 ඉදිරි ඉලක්ක

- බුද්ධිමය දේපළ ලේඛන පරිලෝකනය කර අවසන් කිරීම.

- භූගෝලීය දර්ශක ලියාපදිංචිය සහ දැනුවත් භාවය ප්‍රවර්ධනය කිරීම.

- ප්‍රකාශන හිමිකම් නීතිය සම්බන්ධයෙන් පත්කළ, බුද්ධිමය දේපළ පනතට මරකේෂ් සම්මුතිය අනුව සිදු කර ඇති සංශෝධන යටතේ රෙගුලාසි සකස් කිරීම සහ අනුමැතියට යොමු කිරීම.

- බුද්ධිමය දේපළ නිලධාරීන් බඳවා ගැනීමෙන් පසුව ඉදිරිපත් කර ඇති වැඩ සැලැස්ම අනුව එක් රැස් වී ඇති රාජකාරි අවසන් කිරීමට කටයුතු කිරීම.

- ලේඛනාගාරය ක්‍රමානුකූල කිරීම.

- සාමූහික සංගම් නියාමනය සහ කතෘ භාග එක් රැස් කිරීම සම්බන්ධයෙන් නව රීති සකස් කිරීම.

- භූගෝලීය දර්ශක ලියාපදිංචිය, හිමිකම්, ප්‍රකාශන හිමිකම් ආරක්ෂා කිරීම , වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වන දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම.

- මාර්ගගත ක්‍රමයට අයදුම්පත් ගොනු කිරීමේ අවස්ථාව සහ මාර්ගගත ක්‍රමය ඔස්සේ ගෙවීම් කිරීමේ පහසුකම් ජනතාව වෙත ලබා දීම.

- පේටන්ට් හා කාර්මික සැලසුම් රෙජිස්ටරය පරීක්ෂා කිරීම මාර්ගගත ක්‍රමයට සිදුකිරීමට අවස්ථාව සලසා දීම.

- පේටන්ට් පරීක්ෂාවක් සම්බන්ධව වැය කරනු ලබන කාලය (නවතාවය පිළිබඳ පරීක්ෂාව) මාස 08ක කාලයක් දක්වා අවම කිරීම.

- පේටන්ට් හා කාර්මික සැලසුම් දත්ත ඩිජිටල්කරණය කිරීම සඳහා පේටන්ට් හා කාර්මික සැලසුම් වලට අදාල සියලුම දත්ත IPAS පද්ධතියට ඇතුළත් කිරීම.

- විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා දැනට සිදුකරනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව තවදුරටත් ඉහල නැංවීම.

- TISC ව්‍යාපෘතිය තව දුරටත් පුළුල් කිරීම.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි පුරප්පාඩුව සපුරාලීම සහ අභ්‍යාසලාභීන් දෛනික සේවාවන් සඳහා අනුයුක්ත කිරීම වෙනුවට ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම

තුළින් කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම.

- Front File Scanning ව්‍යාපෘතිය සිදු කිරීම.

- NIPO වෙබ් අඩවිය උත්ශ්‍රේණි (Upgrade) කිරීම.

- NIPO පරිගණක ජාල පද්ධතිය ක්‍රමවත් කිරීම.

එච්. එස්. හෙට්ටිහෙලගෙ
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)

# 3

## තෙවන පරිච්ඡේදය



- **වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය**

3. - ශීර්ෂය 299

3. - බුද්ධිමය දේපළ අරමුදල

# 3. වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය - ශීර්ෂය 299

## 3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - ශීර්ෂය 299

ජීසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 | | සටහන | තත්‍ය 2024 | තත්‍ය 2023 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ජීසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ජීසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ජීසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ජීසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| 64,700,000 | භාණ්ඩාගාර අග්‍රිම | | 58,329,149 | 48,039,988 | ජීසීඒ-3 |
| - | තැන්පතු | | 33,904 | 77,104 | ජීසීඒ-4 |
| 5,000,000 | අත්තිකාරම් ගිණුම | | 4,266,189 | 4,889,654 | ජීසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| 69,700,000 | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **62,629,242** | 53,006,746 | |
| 69,700,000 | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **62,629,242** | 53,006,746 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 254,350 | 619,903 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 62,374,892 | 52,386,843 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 64,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 59,700,274 | 50,309,711 | ජීසීඒ-2(ii) |
| - | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | - | - | ජීසීඒ-2(ii) |
| - | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | - | - | ජීසීඒ-2(ii) |
| 700,000 | පොළී ගෙවීම් | 8 | 327,983 | 406,114 | ජීසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ජීසීඒ-2(ii) |
| 64,700,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **60,028,257** | 50,715,824 | |
| | **මූලධන වියදම්** | | | | |
| - | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | - | - | ජීසීඒ-2(ii) |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | - | - | ජීසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම | 12 | - | - | ජීසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ජීසීඒ-2(ii) |
| - | හැකියා වර්ධනය | 14 | - | - | ජීසීඒ-2(ii) |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | ජීසීඒ-2(ii) |
| - | **මුළු මූලධන වියදම් (උ)** | | - | - | |
| | තැන්පතු ගෙවීම් | | 33,904 | 77,104 | ජීසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 5,649,364 | 4,785,388 | ජීසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 5,683,268 | 4,862,493 | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 65,711,525 | 55,578,317 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (3,336,633) | (3,191,474) | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (3,336,633) | (3,191,474) | ජීසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | ජීසීඒ-3 |
| | | | (3,336,633) | (3,191,474) | |

1

# 3. 2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - ශීර්ෂය 299

ඒසිඒ-8

**2024 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | තතා 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසිඒ-6 | 4,290,494 | 4,290,494 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසිඒ-5/5(ඒ) | 10,321,057 | 8,937,882 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසිඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **14,611,550** | **13,228,376** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 10,321,057 | 8,937,882 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 4,290,494 | 4,290,494 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසිඒ-5(බි) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසිඒ-4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසිඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **14,611,550** | **13,228,376** |

පිටු අංක 06 සිට 21 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 27 සිට 35 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තගර්ත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාතර්‍ාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිංකරන බවත් මෙයින් සහතික කරමි

| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
|---|---|---|
| නම : කේ.ඒ.විමලේන්තිරරාජා | නම : ගීතාංජලී ආර්.රණවක | නම : කේ.ඒ.ඩී.ජේ. කුරුප්පු |
| තනතුර : ලේකම්, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය | තනතුර : බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල් | |
| දිනය : 2025.02.28 | දිනය : 2025.02.28 | දිනය : 2025.02.25 |

කේ.ඒ. විමලේන්තිරරාජා
ලේකම්
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

ගීතාංජලී ආර්. රණවක
බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය
3 වන මහල, "සමාගම් මැදුර"
අංක: 400, ඩී.ආර්. විජයවර්ධන මාවත,
කොළඹ 10.

K.A.D.J.Kuruppu
Accountant(Acting)
National Intellectual Property Office of Sri Lanka,
"Samagam Madura", 3rd Floor,
400, D.R. Wijewardana Mawatha,
Colombo 10.

2

## 3. 3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය - ශීර්ෂය 299

ඒසිඒ-සි

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | තතය | |
|---|---|---|
| | **2024** | **2023** |
| | රු. | රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 3,175,545 | 2,751,373 |
| අග්‍රිම ලැබීම් | 58,120,000 | 48,291,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 3,598,380 | 5,187,876 |
| තැන්පතු ලැබීම් | 33,904 | 77,104 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **64,927,829** | **56,307,353** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 59,447,124 | 49,960,986 |
| සහනාධාර සහ මාරුකිරීම් | 327,983 | 406,114 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 600,868 | 206,846 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 45,201 | 870,915 |
| අත්තිකාරම් ගෙවීම් | 4,472,750 | 4,785,388 |
| තැන්පතු ගෙවීම් | 33,904 | 77,104 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **64,927,829** | **56,307,353** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | - | - |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වියදම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | - | - |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | - | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

3

## 3. 4. මූල්‍ය ප්‍රකාශ සටහන් - ශීර්ෂය 299

<u>වාර්තාකිරීමේ පදනම</u>

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

5

## 3. 5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය - ශීර්ෂය 299

**වගුව - 13 : ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය** (රු.000)

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| - | - | - | - | - | - |

## 3. 6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය - ශීර්ෂය 299

**වගුව - 14 : වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය** (රු.000)

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 64,700 | 64,700 | 60,028 | 93% |
| ප්‍රාග්ධන | 10,000 | 10,000 | 0 | - |

## 3. 7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - ශීර්ෂය 299

**වගුව - 15 : පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්යසාධනය** (රු.000)

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණු | ප්‍රතිපාදන | | තත්‍ය වියදම් | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| - | - | - | - | - | - | - |

## 3. 8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය - ශීර්ෂය 299

**වගුව - 16 : මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය** (රු.000)

| වත්කම් කේතය | කේත විස්තරය | 2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දි ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | - | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 4,290 | 4,290 | - | - |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරී ගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3. 9. විගණකාධිපතිවරයාගේ වාර්තාව - ශීර්ෂය 299

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. IMT/F/IPO/HO/FS/2024/07 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 මැයි 30 දින

බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්,

ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලය

**ශීර්ෂය 299 - ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 299 - ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව බුද්ධිමය දේපල කාර්යාලය දැනුවත් කිරීමේ වැඩසටහන් 50 ක් සංවිධානය කිරීමට වසර තුළ සැලසුම් කර තිබුණද වැඩසටහන් 02ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව බුද්ධිමය දේපළ කාර්යාලය ස්ථිරව නව කාර්යාල පරිශ්‍රයකට ගෙන යාම සඳහා රුපියල් මිලියන 15 ක් ඇස්තමේන්තු කර තිබුණද වර්ෂය තුලදී එම අරමුණ ඉටුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙන් (ICTA) සර්වර් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2016 දෙසැම්බර් 30 දින අවබෝධතා ගිවිසුමකට එළඹී ඇති අතර එදිනම රුපියල් මිලියන 32.5 ක් යන්ත්‍රය මිලදී ගැනීම හා නඩත්තු කටයුතු වෙනුවෙන් එම ආයතනයට ගෙවීම් කර තිබුණි. එම ගිවිසුම සේවා දායක විසින් කඩකිරීම නිසා 2020 පෙබරවාරි 20 දිනැති අංක CP/20/0139/215/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව නැවත ගිවිසුම්ගත වීමට ක්‍රියාමාර්ග ගෙන ඇතත් ගිවිසුම් ගත වී නොතිබුණි. එබැවින් සේවා දායක ආයතනයට ගෙවන ලද මුදල සම්බන්ධයෙන් සාධාරණ විසඳුමක් ලබා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් අදාළ රේඛීය අමාත්‍යාංශය හා ඩිජිටල් අමාත්‍යාංශයේ ලේකම් වෙත 2025 පෙබරවාරි 24 දිනැති අංක NIPO/TT/ 6-4(iv) දරන ලිපිය මගින් ඉල්ලීම් කර ඇතත් මෙම වාර්තාවේ දින වනවිටත් සර්වර් පහසුකම් සම්පාදනය කර ගැනීමට හෝ මුදල් ආපසු අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුව නොතිබුණි.

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කටයුතු සඳහා වසර 04 ක කාලයක සිට ස්ථිර අභ්‍යන්තර විගණකවරයෙක් පත් කර නොතිබුණි.

6. **මානව සම්පත් කළමනාකරණය**

(අ). 2016 දෙසැම්බර් 20 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/1120 දරන ලිපියේ අනු අංක 01 මගින් බුද්ධිමය දේපල නිලධාරී තනතුරු 10 ක් අනුමත කර තිබූ අතර එම තනතුරු ඇතිකල දින සිට 2024 දෙසැම්බර් 31 දක්වා වසර 08 ක් පුරාවටම පුරප්පාඩුව පැවතුණි.

ඉහත අනුමත පුරප්පාඩු 10 පිරවීමට 2024 මාර්තු 14 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී විභාගය පැවැත්වීම සඳහා විභාග දෙපාර්තමේන්තුවට සියයට 50 ක් වූ රු.206,508 ක මුදලක් අනුමැතිය ලැබී මාස 09 ක ප්‍රමාදයක් සහිතව 2024 දෙසැම්බර් 19 දින ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම බඳවා ගැනීම් සිදු කර නොතිබුණි.

(ආ) 2023 දෙසැම්බර් 06 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/1120/VOL II දරන ලිපිය මගින් බුද්ධිමය දේපළ නිලධාරී තනතුරු 08 ක් සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට අනුමැතිය ලබා දී ඇති අතර එම විභාගය පැවැත්වීම සඳහා සියයට 50 ක් වූ රු.533,263 ක මුදලක් 2024 සැප්තැම්බර් 09 දින විභාග දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගැනීම් සිදු කර නොතිබුණි.

(ඇ) 2024 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව අනුව වෙළඳ ලකුණු අංශයේ හා පේටන්ට් අංශයේ කාර්ය සාධනය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට ඉහත පුරප්පාඩු පැවතීම සෘජුවම බලපා තිබුණි.

ඩබ්.ජී.ආර්.එන්.වීරක්කොඩි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

# 3. 2024 වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය - බුද්ධිමය දේපළ අරමුදල

## 3. 10. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - බුද්ධිමය දේපළ අරමුදල

බුද්ධිමය දේපළ අරමුදල

**2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| | සටහන් | 2024.12.31 | 2023.12.31 |
|---|---|---|---|
| <u>අයභාරය</u> | | රු. | රු. |
| වෙළඳ ලකුණු ආදායම | 3 | 79,517,675 | 67,913,103 |
| පේටන්ට් ආදායම | 3 | 7,494,665 | 6,707,171 |
| කාර්මික සැලසුම් ආදායම | 3 | 492,392 | 391,958 |
| වෙනත් ආදායම් | 4 | 454,081 | 588,142 |
| ආයෝජන පොලී ආදායම් | 5 | 176,407,646 | 299,516,901 |
| **මුළු අයභාරය** | | **264,366,459** | **375,117,275** |
| <u>වියදම්</u> | | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | 2 | 7,045,653 | 4,595,371 |
| ප්‍රදාන හා වෙනත් හුවමාරු ගෙවීම් | 2 | 2,145,443 | 2,350,157 |
| සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය | 2 | 55,855,648 | 53,829,046 |
| වෙනත් | 2 | 602,358 | 225,065 |
| ක්ෂය සහ ක්‍රම ක්ෂය | 2 | 8,865,017 | 5,692,703 |
| **මුළු වියදම්** | | **74,514,119** | **66,692,342** |
| **කාල පරිච්ඡේදය සඳහා වූ අතිරික්තය/ඌනතාවය /අයභාරය** | | **189,852,340** | **308,424,933** |

## 3. 11. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - බුද්ධිමය දේපළ අරමුදල

බුද්ධිමය දේපළ අරමුදල

2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | සටහන් | 2024.12.31 | 2023.12.31 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල් හා සමාන විෂයයන් | 8 | 1,666,768 | 2,446,946 |
| ලිපි ද්‍රව්‍ය ඉතිරි තොගය | 1 | 8,789,357 | 5,935,144 |
| ලැබිය යුතු ආදායම් | 9 | 27,590,578 | 235,940,624 |
| කෙටි කාලීන ආයෝජන | 7 | 1,568,384,661 | 1,165,841,859 |
| ලැබිය යුතු මැතිවරණ දීමනා | | 403,916 | - |
| | | **1,606,835,280** | **1,410,164,573** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 6 | 35,745,684 | 40,448,574 |
| ලැබිය යුතු ප්‍රතිපූර්ණය කිරීම් - බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථාන | | 22,298,751 | 22,298,751 |
| | | **58,044,435** | **62,747,325** |
| **මුළු වත්කම්** | | **1,664,879,714** | **1,472,911,898** |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | | | |
| උපචිත වියදම් | 11 | 6,540,816 | 5,068,875 |
| කාර්යසාධන බැඳුම්කරය | | 128,380 | - |
| **මුළු බැරකම්** | | **6,669,216** | **5,068,875** |
| **ශුද්ධ වත්කම්** | | **1,671,548,921** | **1,477,980,773** |
| **ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | | | |
| සමුච්චිත අතිරික්තය / ඌණතාවය | | 1,658,210,498 | 1,468,102,178 |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | **1,658,210,498** | **1,468,102,178** |

**කේ.ජ්.ඩී.ජේ. කුරුප්පු**
**ගණකාධිකාරී (වැ.බ.)**

කේ.ජී.ඩී.ජෙ. කුරුප්පු
ගණකාධිකාරී(වැ.බ.)
ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කා...
"සමාගම් මැදුර", 3 වන මහල.
400, ඩී. ආර්. විජේවර්ධන මාවත.
කොළඹ 10

**ගීතාංජලී ආර්. රණවක**
**බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්**

ගීතාංජලී ආර්. රණවක
බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය
3 වන මහල, "සමාගම් මැදුර"
අංක: 400, ඩී.ආර්. විජයවර්ධන මාවත,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආ.ක්‍ර.ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව බුද්ධිමය දේපළ අරමුදලේ ගණන් විගණනය කිරීමේ කාර්යය සඳහා 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතෙහි 176 (5) වගන්තිය අනුව සකස් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශය 2025.02.28 දින අනුමත කරන ලදි.

**කේ.ජ්. විමලේන්තිරරාජා**
**ලේකම්**
**වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය**

කේ.ඒ. විමලේන්තිරරාජා
ලේකම්
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03

1 | Page

## 3. 12. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය - බුද්ධිමය දේපළ අරමුදල

බුද්ධිමය දේපළ අරමුදල

**2024.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**සෘජු ක්‍රමය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2024.12.31 | 2023.12.31 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | රු. | රු. |
| **ලැබීම්** | | |
| බදු | 3,550 | 4,075 |
| භාණ්ඩ හා සේවා විකිණීමෙන් | 131,257,098 | 112,518,348 |
| පොලී ලැබීම් | 384,757,670 | 83,535,609 |
| අනෙකුත් ලැබීම් | 788,311 | 2,550,902 |
| **ගෙවීම්** | | |
| සේවක පිරිවැය | (5,186,607) | (4,584,780) |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | (63,224,291) | (52,524,049) |
| අනෙකුත් ගෙවීම් | (2,921,542) | (4,183,066) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **445,474,167** | **137,317,040** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| පිරියත හා උපකරණ මිලදී ගැනීම | (4,393,430) | (17,174,724) |
| පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබීම් | | - |
| ආයෝජන කල්පිරීමෙන් ලැබීම් | 3,547,841,630 | 1,112,709,277 |
| ආයෝජන මිලදී ගැනීම් | (3,950,384,432) | (1,201,941,691) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(406,936,233)** | **(106,407,138)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| බදු මුදල් ආපසු ගෙවීම් | (3,550) | (6,549) |
| රජයට බෙදාහැරීම් | (39,314,585) | (37,703,279) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(39,318,135)** | **(37,709,828)** |
| මුදල්, මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩි වීම්/ (අඩුවීම ) | 780,178 | (6,799,926) |
| 2024.01.01 දිනට මුදල්, මුදල් හා සමාන දෑ | 2,446,946 | 9,246,872 |
| **2024.12.31 දිනට මුදල්, මුදල් හා සමාන දෑ** | **1,666,767** | **2,446,946** |

බුද්ධිමය දේපළ අරමුදල

2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රදවාගත් ලාභය/ අලාභය | වෙනත් සංචිත | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **2023.01.01 දිනට ශේෂය** | 1,153,970,944 | - | 5,578,250 | 1,159,549,224 |
| පූර්ව වර්ෂ ගැලපුම් | - | 128,021 | - | 128,021 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | 308,424,933 | - | 308,424,933 |
| **2023.12.31 දිනට ශේෂය** | **1,153,970,974** | **308,552,954** | **5,578,250** | **1,468,102,178** |
| **2024.01.01 දිනට ශේෂය** | 1,462,523,928 | - | 5,578,250 | 1,468,102,178 |
| පූර්ව වර්ෂ ගැලපුම් | - | 256,000 | - | 256,000 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | 189,852,340 | - | 189,852,340 |
| **2024.12.31 දිනට ශේෂය** | **1,462,523,928** | **190,108,340** | **5,578,250** | **1,658,210,518** |

## 3. 13. මූල්‍ය ප්‍රකාශ සටහන් - බුද්ධිමය දේපළ අරමුදල

**අවසාන ගිණුම් සඳහා අදාළ වන ගිණුම් සටහන්**

**මූලික ගිණුම් ප්‍රතිපත්ති සහ ප්‍රකාශන**

- 2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.
- මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.
- ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් පිළියෙල කර ඇත.
- මූල්‍ය වාර්තා සකස් කිරීමේ දී පදනම් කර ඇත්තේ ඓතිහාසික පිරිවැය සංකල්පය වේ. මෙම ගිණුම් ඉදිරිපත් කිරීමේ දී උද්ධමනය සඳහා ගැලපුම් කර නොමැත.
- ද්‍රව්‍යාත්මක බව, ඒකාකාරී බව හා අඛණ්ඩ පැවැත්ම, උපචිත පදනම් පිළිබඳ සංකල්පය පදනම් කර ගිණුම් ඉදිරිපත් කර ඇති අතර එහි දී යථායෝග්‍යතාව පිළිබඳ සැලකිල්ලක් දක්වා ඇත.
- වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්ති

  ස්ථාවර වත්කම් සරල මාර්ග ක්ෂය පදනම මත වත්කම් වල ඵලදායී ජීවිත කාලය පුරා ක්ෂය කරනු ලැබේ.

  වත්කම් ක්ෂය කිරීමේ අනුපාත.

| | |
|---|---|
| කාර්යාල උපකරණ | 10% |
| කාර්යාල සවි කිරීම් | 10% |
| ලී බඩු හා උපකරණ | 05% |
| මෝටර් රථ | 10% |
| තිර රෙදි | 20% |
| පොත් පත් | 10% |
| පරිගණක | 25% |
| ජාල එලීම | 5% |

- ආයෝජනයන් ඒවායේ මුහුණත අගය හා පිරිවැය යන අගයන් දෙකෙන් අඩු අගයට ගිණුම් ගත කර ඇත.
- උපචිත වියදම් 2025 පෙබරවාරි මස 10 දින දක්වා ගණනය කර ඇත.
- 2024.12.31 දිනට ඉතිරි ලිපිද්‍රව්‍ය තොගය රු. 8,789,357 කි.
- ව්‍යාපෘතියේ වියදම් තුළ ඇතුළත් ස්ථාවර වත්කම් අරමුදලේ ස්ථාවර වත්කම් තුළ ගිණුම්ගත කර ඇත.
- සේවා සැපයීම වෙනුවෙන් ගිණුම් වර්ෂයට අදාලව ලැබෙන ආදායම, ගිණුම් වර්ෂයට අදාළ ව හඳුනා ගන්නා අතර ආයෝජන වෙනුවෙන් ලැබෙන ආදායම කාලයට සමානුපාතික ක්‍රමයකට අනුව ගිණුම් ගත කර ඇත.

5 | Page

❖ බුද්ධිමය දේපළ අරමුදල පරිපාලනය කිරීමේ කටයුතු වෙනුවෙන් බුද්ධිමය දේපළ කාර්යාලයේ නිලධාරීන් සඳහා ගෙවනු ලබන වැටුප් හා දීමනා ඇතුළු අයභාර වියදම් සඳහා රු. 59,700,274 ක මුදලක් විසර්ජන වැය ශීර්ෂය 299 යටතේ රජය විසින් දරනු ලැබ ඇත.

❖ අංක අමප/15/0272/625/007 හා 2015.04.23 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් බුද්ධිමය දේපළ ප්‍රවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීමට වැය කළ මුදල්, නාගරික සංවර්ධන අධිකාරියෙන් අය කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2015.04.23 දින ලැබී ඇත. එය අනුව අදාළ මුදල් ප්‍රතිපූරණය කරන මෙන් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලීම් කර තිබේ.

❖ බුද්ධිමය දේපළ අරමුදලට විරුද්ධව පැවරූ කිසිදු නඩුවක් නැත. බුද්ධිමය දේපළ කාර්යාලය ප්‍රධාන අවස්ථා දෙකක දී බුද්ධිමය දේපළ විෂයයට අදාලව පාර්ශවකරුවෙක් ලෙස නම් කරනු ලැබේ.

i. බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගන්නා ලද බුද්ධිමය දේපළ විෂයයට සම්බන්ධ ඒක - පාර්ශවීය තීරණවලට, විශේෂයෙන් වෙළඳ ලකුණු අයදුම්පත් සම්බන්ධ තීරණවලට එරෙහිව කොළඹ මහාධිකරණයට අයදුම්කරුවන් විසින් අභියාචනා කිරීම.

ii. වෙළඳ ලකුණු අයදුම්පත් සම්බන්ධ විරෝධතා ගොනු කිරීමක දී බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගනු ලබන තීරණයකට එරෙහිව අදාල පාර්ශව විසින් කොළඹ මහාධිකරණයට අභියාචනා කිරීම.

❖ ශේෂ පත්‍ර දිනට පසුව සිදුවීම් නොමැත.

❖ සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු සිදුකර නොමැත.

## 3. 14. වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය - බුද්ධිමය දේපළ අරමුදල

වගුව - 17 : වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය (රු.000)

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 118,262.00 | 118,262.00 | 65,046.74 | 55.00% |
| ප්‍රාග්ධන | 38,625.00 | 38,625.00 | 9,467.38 | 24.51% |

## 3. 15. විගණකාධිපතිවරයාගේ වාර්තාව - බුද්ධිමය දේපළ අරමුදල

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. } IMT/F/IPF/2024/05 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2025 ජූනි 24 දින

බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික බුද්ධිමය දේපල අරමුදල.

**ජාතික බුද්ධිමය දේපල අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ජාතික බුද්ධිමය දේපල අරමුදලේ අරමුදලේ ("අරමුදල") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

3

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | **නීති, රීති / විධානයට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය. | අරමුදල සඳහා අභ්‍යන්තර විගණනකවරයෙකු පත්කර හෝ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර හෝ නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 757 (2) | භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 සහ 2022 දෙසැම්බර් 20 දිනැති අංක 01/2020(ii) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ | සේවා සම්පාදනය සඳහා අයකරන ගාස්තු ඉහළ නංවා සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වුවද කාර්යාලය විසින් අයකරන වෙළඳ ලකුණු කාර්මික සැලසුම් සහ පේටන්ට් ලබාදීම සඳහා වන ගාස්තු සංශෝධනය කර ගැසට් කර නොතිබුණි. |

### 3.2 කාර්යසාධනය

(අ) සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් භූමියක බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2008/2009 වර්ෂවලදී බුද්ධිමය දේපළ අරමුදලින් රු.මිලියන 22.29 ක වියදමක් දරා ඇති නමුත් එම ගොඩනැගිල්ල පිහිටි ඉඩම සංචාරක කර්මාන්ත ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරිය අත්පත් කරගෙන තිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය කළ මුදල නාගරික සංවර්ධන අධිකාරියෙන් අයකර ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී වසර 09 ක කාලයක් ගතවී තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, අරමුදලේ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිලි කුලී ලෙස අරමුදල විසින් රු.මිලියන 14 කට අධික මුදලක් වාර්ෂිකව සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ගෙවමින් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.26,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ ක්‍රියාකාරකම් 06 කට අදාළ කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මුළු ආදායම රු.264,366,459 ක් වූ අතර ඉන් සියයට 66.73ක් ආයෝජන පොළියෙන් ද, සියයට 33.27 ක් බුද්ධිමය දේපළ පනත යටතේ අයකරන ගාස්තුවලින් ද සමන්විත වී තිබුණි. මෙම ගාස්තු ආදායමින් සියයට 30.08 ක් වෙළඳ ලකුණු ලියාපදිංචිය මත රැස් කළ ආදායම් විය. ඒ අනුව බුද්ධිමය දේපළ පනත ක්‍රියාත්මක කිරීම යටතේ කාර්මික සැලසුම් හා පේටන්ට් බලපත්‍රවලින් ලබන ආදායම සාපේක්ෂව අඩු මට්ටමක පැවතුණි.

(ඈ) 2023 හා 2024 වර්ෂවලදී පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීම පිළිවෙලින් දේශීය 59 ක් හා 40 ක් ද විදේශීයව 141 ක් හා 147 ක් ද ලෙස මුළු එකතුව 200 ක් හා 187 ක් වූ අතර 2024 වර්ෂයේ දී මුළු පේටන්ට් ප්‍රදානය කිරීම සියයට 6.5 කින් පහළ වැටී තිබුණි. තවද පේටන්ට් අංශයේ පේටන්ට් අයදුම් පත්‍ර පරීක්ෂා කිරීම් සංඛ්‍යාව 2023 වර්ෂයේ 895ක් වුවත් 2024 වර්ෂයේදී එය 595 ක් දක්වා සියයට 33.5 කින් අඩු වී තිබුණි.

